# ත්‍රිපිටක ධර්මය

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

## දෙවන ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ත්‍රිපිටක ධර්මය**
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
දෙවන ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0511-9

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

මුද්‍රණය :
නියෝ ග්‍රැෆික්ස් (පුද්) සමාගම
නො. 44, උඩහමුල්ල දුම්රියපළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායී බව උදෙසා පෙළපොත්, විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශ වලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක් වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීනව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රම ශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශ, ඔබට මහඟු පිටුවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රම ශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂය මාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහාඅධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එකම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනයයි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ ‘පිරිවෙණ’ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දයකත්වයක් නොතිබුණි.

පිරිවෙන් අංශයක්/ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමැතිතුමන් 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No. 5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායකවීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජුව හැකි විය. ජාතික අධ්‍යාපාන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදුතාව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කරගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙනෙහි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් සමයාන්තර ඥාණයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥාණයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥාණයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුන ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙනට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳ ව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය සම්බන්ධීකරණය විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

# විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :**

ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම :**

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**විජිත වෙලගෙදර**
අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්ෂණය :**

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය :**

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය

**පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය :**

**පූජ්‍ය උඩුගම සුදස්සි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෙපාර්තමේන්තු ප්‍රධාන, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය :**

**කේ. ඒ. වීරසේන**
මහාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :**

**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**පූජ්‍ය වැවගෙදර සීලක්ඛන්ධ හිමි**
ගුරු උපදේශක (ගම්පහ), කැල/සුශීලෝදය මූලික පිරිවෙන, කඳුබොඩ, දෙල්ගොඩ

**පූජ්‍ය මාදුවේ කෝලිත හිමි**
පරිවේණාචාර්ය, මිනු/ විජයමංගල මූලික පිරිවෙන, යටියන, මිනුවන්ගොඩ

**ඊ. ඒ. ජයසේන එදිරිසිංහ**
විශ්‍රාමික විෂය උපදේශක, අංක 498 බී, කොස්වත්ත, රදාවාන

**එල්. එන්. ඒ. වීරසිංහ**
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල

**එච්. එම්. සෙනෙවිරත්න**
ශ්‍රී ලංකා ගුරු සේවය I, බුද්ධ ජයන්ති මහා විද්‍යාලය, බලංගොඩ

**එම්. එම්. සී. එස්. බණ්ඩාර**
පරිවේණාචාර්ය, ගම්/ නාලිකේරාරාම ධර්මායතන මූලික පිරිවෙන, මීවිටිගම්මන

**භාෂා සංස්කරණය :**

**වීරසිරි සොයිසා**
විශ්‍රාමික පරිවේණාචාර්ය, අංක 157/සී/34, රාජසිංහ මාවත, ඉහළ ඉඹුල්ගොඩ

**පරිගණක වදන් :**

**පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන**
පරිගණක අංශය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**විවිධ සහාය :**
පී.ජී. බුද්ධිකා කරුණාරත්න
කළමනාකරණ සේවා නිලධාරී
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් ප්‍රතිබල සම්පන්න භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ පරමාර්ථයයි. ශාක්‍යමුනීන්ද්‍ර ගෞතම බුදුරජාණන් වහන්සේ මෙලොවට දායාද කළ නෛර්‍යාණික ශ්‍රී සද්ධර්මය අධ්‍යාත්මය සුවපත් කරලීම උදෙසා පවත්වාගෙන යාමේ මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය උදෙසා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ප්‍රබල දායකත්වයක් සපයයි.

පිරිවෙන් අධ්‍යාපනය වඩාත් ඵලදායී හා ගුණාත්මක අර්ථ පූර්ණ භාවයට පත් කරලීම උදෙසා වර්තමාන අධ්‍යාපන ප්‍රවාහය තුළ ක්‍රියාත්මක නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දී ඇත. ඒ ඔස්සේ විෂය මාලා ප්‍රතිසංස්කරණය සිදු කර පරිවේණාචාර්යවරුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමට ක්‍රියාකර ඇත. ඒ අනුව විෂය නිර්දේශය පෙළපොත සම්පාදනයෙන් අනතුරුව ගුරු මාර්ගෙ ෝපදේශය සකස් වන්නේ ඵලදායී බව තවත් වැඩිකර ගැනීමේ අරමුණ පෙරදැරි කොට ගෙනයි.

ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධානතම විෂය ධාරාව වන්නේ ත්‍රිපිටක ධර්මයයි. ත්‍රිපිටක අධ්‍යාපනයෙන් තොරව භික්ෂු අධ්‍යාපනය සාර්ථකත්වය කරා පියමැනිය නොහැක. සූත්‍ර, විනය, අභිධර්මය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් වර්තමාන භික්ෂූන් වහන්සේ ලබා ගැනීම යුගයේ අවශ්‍යතාවක් ද වෙයි. සම්බුද්ධ ශාසනය විෂයෙහි එල්ලවන නොයෙක් අභියෝග ජය ගැනීමට ඇති එක ම විසඳුම වන්නේ භික්ෂූන් වහන්සේ ප්‍රතිබල සම්පන්න වීමයි.

ත්‍රිපිටක ධර්මය විෂය භාර ගුරු භවතා දැඩි වගකීමෙන් යුතු ව ක්‍රියා කරන්නේ නම් යථෝක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා පහසු ය. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම මෙන් ම නූතන අධ්‍යාපන ක්‍රමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් කරා ශිෂ්‍ය ප්‍රජාව මෙහෙයවීම ඔවුන්ගේ වගකීමක් බව ද අවධාරණය කරමි.

ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයාණන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම සරල ය. ප්‍රායෝගික ය. අවස්ථෝචිත ය. තමන් වහන්සේ හමුවට පැමිණෙන තැනැත්තාගේ මානසික ස්වභාවය හඳුනාගෙන ඊට අවශ්‍ය මාර්ගෝපදේශ සලස්වාදීමට බුදුරජාණන් වහන්සේ ක්‍රියාකළ අන්දම සූත්‍ර දේශනාවන් පරිශීලනය කරන විට මෙන් ම සම්බුද්ධ චරිතය හදාරන විට අපට මැනවින් පසක් වේ.

නූතන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළින් ද ගුරුවරයා ශිෂ්‍යයාට මාර්ගෝපදේශකයකු ලෙස ඉගෙනුම් අවස්ථා හා පරිසර නිර්මාණය කරදීමට දක්ෂයකු විය යුතු බව අවධාරණය කර ඇත. ත්‍රිපිටක ධර්මය විෂය, විෂය දැනුමින් එහා ගිය පුද්ගල අධ්‍යාත්මය සංවර්ධනය ඉලක්ක කර ගත් දාර්ශනික ප්‍රවාහයකි. විෂය ක්ෂේත්‍ර වශයෙන් ගත් කළ පුද්ගලයාගේ සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂා වර්ධනය උදෙසා අවශ්‍ය මාර්ගෝපදේශ ත්‍රිපිටකය තුළින් මනාව විග්‍රහ වී ඇත.

පිරිවෙන් ත්‍රිපිටක ධර්මය විෂය මාලාව සකස් කිරීමේ දී එම සියලු ක්ෂේත්‍ර පරිශීලනය කිරීමට අවශ්‍ය මූලික දැනුම අන්තර්ගත කිරීමට අප උත්සාහ දරා ඇත.

බුද්ධ චරිතය, චරිත කතා, විනය, සූත්‍ර, අභිධර්මය, ධම්ම පදය, භාවනා, මූලික ධර්ම කරුණු, බෞද්ධ සමාජ හා සංස්කෘතිය, ශාසනික චර්යා හා වත් පිළිවෙත් ආදි ක්ෂේත්‍ර හරහා නවක භික්ෂුවකට සිය භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා වන මග පෙන්වීම් ලබා දීමට හැකි වී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී මෙහි ඇතුළත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය ඔබේ ඉගැන්වීම් ක්‍රමයට පහසුවක් වනු ඇත. මෙහි යෝජනා කර ඇති පාඩම් සැලසුම් එලෙසින් ම භාවිත කිරීම අනිවාර්ය නොවන අතර එය මග පෙන්වීමක් බව සලකන්න. ඔබේ ප්‍රදේශයේ, පිරිවෙන් සංස්කෘතියේ මෙන් ම ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව එය ගැළපෙන ලෙස භාවිත කළ හැකි ය. එහෙත් මෙම ගුරු මාර්ගෝපදේශය යෝජනා කර ඇති නිපුණතා හා නිපුණතා මට්ටම් වෙනස් නොකළ යුතු බව අවධාරණය කරමි. පන්තියට අදාළ පෙළපොත ද භාවිත කරමින් ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලියට සංවිධානය කොට පාඩම් අවසානයේ දී එම නියමිත ඉගෙනුම් පල ඔස්සේ නිපුණතා මට්ටමට ළඟාවීම අපේක්ෂා කෙරේ. එසේ නිපුණතා මට්ටම් කීපයක් මගින් නිපුණතාවට ශිෂ්‍යයා මෙහෙයවිය යුතු ය.

ඔබගේ නව නිර්මාණ හා අදහස් ද එක්කොට ගනිමින් ප්‍රාදේශීය වශයෙන් හෝ ඔබ පිරිවෙනට ආවේණික සංස්කෘතියට අනුව පාඩම් සැලසුම් සකස්කොට ගන්න. එහි දී වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත වන නවීන තාක්ෂණික මෙවලම් ද ඔබ හැකි තරම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන්න. එහි දී ත්‍රිපිටක ධර්ම විෂයයට එම උපකරණ ගැළපේ දැයි සිතන්න. උපකරණ භාවිතයේ දී බෞද්ධ සංස්කෘතියට හෝ ආගමික වටපිටාවට හෝ ශිෂ්‍ය විනය ට හානි නොවන ලෙස භාවිතයට කටයුතු කරන්න.

පාඩම ආරම්භයේ දී ආකර්ෂණීය මෙන් ම ප්‍රබෝධාත්මක පිවිසීම් භාවිත කිරීම වැඩි ප්‍රතිඵල ලැබීමට රුකුලක් වනු ඇත. පාඩම් සංවර්ධනයේ දී භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් හැකි උපරිමයෙන් භාවිත කරන්න. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබ පන්ති කාමරයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරමින් පාඩම් සංවර්ධනය කිරීම වැඩි ප්‍රතිඵලදායක බව අවධාරණය කරමි.

ත්‍රිපිටක ධර්මය විෂය සාර්ථකව ශිෂ්‍යයා වෙත වෙත යොමු කිරීම අප සතු යුතුකමකි. ඒ සඳහා ශිෂ්‍යයා මැනවින් තේරුම් ගෙන ඊට ගැළපෙන ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීම අඛණ්ඩව කළ යුතු ය. අදාළ නිපුණතා මට්ටමට ළඟාවීමට අවශ්‍ය තක්සේරු හා ඇගයීම් නිර්ණායක සකස් කොට ඇගයීමට ලක් කරමින් අපහසුතා දක්වන සිසුන් වෙතොත් නැවත නැවත ඇගයීමට ලක් කරමින් නිපුණතා මට්ටමට ළඟා වන්න ශිෂ්‍යයාට දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කර සටහන් තබන්න. සෑම පාඩමක් අවසානයේ දී ම හැකි තරම් අභ්‍යාසවල ශිෂ්‍යයින් යොමු කිරීමට කටයුතු කරන්න. ශිෂ්‍යයාට ප්‍රායෝගික අවස්ථා වැඩිමනක් ලබා දී මෙය නිපුණතාවට ළඟාවීමට හැකි බව සිතන්න.

ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී ගුරු භවතුන් මෙකී කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කොට ශාසනික චර්යාවෙන් ද ආකල්ප සම්පත්තියෙන් ද දැනුමෙන් ද පරිපූර්ණ ශිෂ්‍ය පිරිසක් උදෙසා තම මගපෙන්වීම ලබාදීම අගය කොට සලකමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
දෙපාර්තමේන්තු ප්‍රධානී
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


| | පිටුව |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂය මාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix-x |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xi-xii |
| ජාතික අරමුණු | xiv |
| මූලික නිපුණතා | xv-xvi |
| ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු | xvii |
| ත්‍රිපිටක ධර්මය 2 ශ්‍රේණිය - වාර නියමය | xviii |
| විෂය නිර්දේශය | xix-xxiv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxv |
| 1 පාඩම - තිලොවග බුදු පදවි ලබති | 1-2 |
| 2 පාඩම - සත් සතිය ගෙවුණු හැටි | 3-4 |
| 3 පාඩම - පස්වග තවුසන් සොයා යාම | 5-6 |
| 4 පාඩම - මංගල ධර්ම දේශනය | 7-8 |
| 5 පාඩම - බුදු සසුනේ ප්‍රථම ධර්ම දූත මෙහෙවර ඇරඹෙයි | 9-10 |
| 6 පාඩම - දහම එතෙර මෙතෙර පැතිර යයි | 11-12 |
| 7 පාඩම - උපන් ගමට වැඩම වීම | 13-14 |
| 8 පාඩම - සිවුවනක් පිරිස සපිරෙයි | 15-17 |
| 9 පාඩම - අග්‍ර උපස්ථායක ආනන්ද හාමුදුරුවෝ | 18-19 |
| 10 පාඩම - මහා ධර්මපාල ජාතකය | 20-21 |
| 11 පාඩම - සීල විමංස ජාතකය | 22-23 |
| 12 පාඩම - සෝණක ජාතකය | 24-25 |
| 13 පාඩම - බුදු දහමින් රට පාලනය කළ සක්විති රජතුමා | 26-27 |
| 14 පාඩම - බෝසත් සෙවනැල්ල වන් යසෝධරා තෙරණියෝ | 28-29 |
| 15 පාඩම - බුදු පුතුන් රකින බොදු මව්වරු | 30-31 |
| 16 පාඩම - සසුන් ගමනින් ලොවම සැනසූ පොඩි හාමුදුරුවෝ | 32-33 |
| 17 පාඩම - සිල් පිරෙන්නට වත් පුරමු | 34-35 |
| 18 පාඩම - මහණකම නම් උසස් ම ශීලාචාරකමයි | 36-37 |
| 19 පාඩම - ධම්ම පදය - I | 38-39 |
| 20 පාඩම - ධම්ම පදය - II | 40-41 |
| 21 පාඩම - ධම්ම පදය - III | 42-43 |
| 22 පාඩම - ධම්ම පදය - IV | 44-45 |
| 23 පාඩම - මංගල සූත්‍රය | 46-47 |
| 24 පාඩම - කය නම් අසාරය | 48-49 |
| 25 පාඩම - දැන දැන සිහියෙන් වැඩ කරමු | 50-51 |
| 26 පාඩම - ජීවිතය අනියතයි මරණය නියතයි | 52-53 |
| තක්සේරුකරණ හැඳින්වීම | 54-55 |

## ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව ඇගයීම්වලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

### iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

### v. ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

### vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

### vii. ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන පැවිදි හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගී කර ගනිමින් සිව්වණක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කර ගත් දහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනඟා ගැනීමට විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයෙන් භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනඟා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනයෙන් ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික හා ශාසනික උරුමය රැකගැනීමටත්, විධිමත්ව පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීම සඳහා යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගිත්වයෙන් ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ද ගොඩනඟා ගැනීමට, ගිහි ජනතාවට මඟ පෙන්වීමට සඳහා අවශ්‍ය හැකියාව ලබාදීම.

## ත්‍රිපිටක ධර්මය - 2 ශ්‍රේණිය

## වාර නියමය

| නිපුණතා මට්ටම / පාඩම | | කාලච්ඡේද |
|---|---|---|
| 1 වාරය | 1.1 - 1, 2, 3 පාඩම්<br>2.3 - 10 පාඩම<br>2.1 - 16 පාඩම<br>2.2 - 15 පාඩම<br>4.1 - 23 පාඩම<br>6.1 - 24 පාඩම | 60 |
| 2 වාරය | 1.2 - 4, 5, 6 පාඩම්<br>2.3 - 11 පාඩම<br>2.1 - 14 පාඩම<br>3.1 - 17 පාඩම්<br>5.1 - 19, 20, 21 පාඩම්<br>6.2 - 25 පාඩම | 60 |
| 3 වාරය | 2.1 - 7, 8, 9 පාඩම්<br>2.3 - 12 පාඩම<br>2.2 - 13 පාඩම<br>3.1 - 18 පාඩම<br>5.1 - 22 පාඩම<br>6.1 - 26 පාඩම | 60 |

- **පෙළ පොතේ පාඩම් පිළිවෙළට අනුව නිපුණතා දක්වා ඇත.**

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1. සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින, චරිතායනය කරයි. | 1.1 බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අධ්‍යයනය කර, චරිතායනය කරයි. | බුදුබව ලැබීම, සත් සතිය, පස්වග තවුසන් සොයා යෑම. | ● බෝසත් චරිතයෙන් පැහැදිලි වන ගුණ විස්තර කරයි.<br>● බෝසත් චරිතය ආදර්ශයෙන් පිරී ඇති බව පිළිගනියි.<br>● ''බෝසත් චරිතය තම ජීවිතයට ආදර්ශ සපයයි'' යන මැයෙන් රචනාවක් ගොඩ නගයි.<br>● දැහැමිව කටයුතු කරයි.<br>● බෝසත් දිවියක් ගත කරයි. | 20 |
| | 1. 2 බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශය සිදු වූ ආකාරය දැන, ආදර්ශයෙන් කටයුතු කරයි. | දම්සක් පැවතුම් සූත්‍රය, ප්‍රථම ධර්මදූත පිරිස, ධර්ම ප්‍රචාරය, කිඹුල්වත්පුර චාරිකාව, සිව්වණක් පිරිසේ ආරම්භය, අග්‍ර උපස්ථායක තනතුර. | ● ශාසනික මෙහෙවරෙහි ආරම්භය සිදු වූ අයුරු පැහැදිලි කරයි.<br>● ධර්මදූත සේවාව ක්‍රමයෙන් විකාශය වූ බව පිළිගනියි.<br>● ප්‍රථම ධර්මදූත කණ්ඩායම ලැයිස්තු ගත කරයි.<br>● කළගුණ සැලකීමෙන් කටයුතු කරයි.<br>● අන්‍යයන්ට උදව් කරයි. | 31 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2. භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට,බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි. | 2.1 බෞද්ධ ජාතක කථාවල ජීවිතාදර්ශ ලබාගෙන, තම දිවිය සාර්ථක කරගනියි. | මහා ධර්මපාල ජාතකය, සීලවිමංස ජාතකය, සෝණක ජාතකය. | • ජාතක කථා තුළින් බෝසත් චරිතය පිළිබිඹු වන බව විස්තර කරයි.<br>• ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගනියි.<br>• ජාතක කථා කීපයක් තුළින් ආදර්ශ වගුගත කරයි.<br>• යහපත් චරිත ආදර්ශකොට ගනියි.<br>• සාර්ථක ජීවිතයකට මග, සලසා ගනියි. | 20 |
| | 2.2 බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනයෙන්, තම ජීවිතය සාර්ථක කර ගනියි. | නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ, යශෝධරා තෙරණිය. | • ආදාළ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත විස්තර කරයි.<br>• ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තම ජීවිතයට ආදර්ශ සපයන බව පිළිගනියි.<br>• ශ්‍රාවක ශ්‍රාවිකා චරිත කිහිපයක් ඇසුරින් මතුවන ආදර්ශ වගුගත කරයි.<br>• ශ්‍රද්ධා සිතින් කටයුතු කරයි.<br>• අන් අයට ආදර්ශවත් වෙයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශය සිදු වූ ආකාරය දැන, ආදර්ශයෙන් කටයුතු කරයි. | මාතික මාතා, ධර්මාශෝක රජු. | ● අදාළ උපාසක උපාසිකා චරිත විස්තර කරයි.<br>● උපාසකයෙකු හෝ උපාසිකාවක වීමට නිවැරැදි ජීවිතයක් ගත කළයුතු බව පිළිගනියි.<br>● බෞද්ධ උපාසක උපාසිකාවන්ට උදාහරණ සපයයි.<br>● උපාසකයෙකු හෝ උපාසිකාවක ලෙස කටයුතු කරයි.<br>● දැහැමිව ජීවත් වෙයි. | 09 |
| 3. බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගසා ගනියි. | 3.1 භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ප්‍රගුණ කරයි. | වත්තක්ඛන්ධකය, සේඛියා. | ● භික්ෂු ජීවිතයට විනයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරයි.<br>● භික්ෂු ජීවිතය හා භික්ෂු විනයෙහි ඇති සබඳතා පිළිගනියි.<br>● භික්ෂු ජීවිතයට අදාළ ශික්ෂාපද ලේඛනගත කරයි.<br>● විනයානුකූල ජීවිතයක් ගත කරයි.<br>● සමගියෙන් කටයුතු කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4. ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා සාර්ථක යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසාගනියි. | 4.1 බෞද්ධ සූත්‍රවල ඇතුළත් දහම් කරුණු භික්ෂු ජීවිතයට එකතු කර, කටයුතු කරයි. | මහා මංගල සූත්‍රය. | ● මහා මංගල සූත්‍රයේ නිදාන කථාව පැහැදිලි කරයි.<br>● මංගල කරුණු භික්ෂු ජීවිතයේ මෙලොව පරලොව දෙකට ම ගුරුකොට ගත හැකි බව පිළිගනියි.<br>● මංගල කරුණු බාල, තරුණ, මහලු යන අවධිවලට වැදගත් වන ලෙස ලැයිස්තුගත කරයි.<br>● මංගල කරුණු ජීවිතයට එක්කර කටයුතු කරයි.<br>● විචාරශීලී ව වැඩ කටයුතු කරයි. | 12 |
| 5. බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර, අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන්, සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි. | 5.1 ධම්මපද ගාථා ගුරුකොට, තම ජීවිතය සාර්ථක කොට, ආදර්ශ සපයයි. | යමක වග්ගය, අප්පමාද වග්ගය. | ● “ධම්මපදය” පිළිබඳ පැහැදිලි කරයි.<br>● ධම්මපදය සාර්ථක ජීවිතයකට මග සලසන බව පිළිගනියි.<br>● අදාළ ධම්මපද ගාථා මතකයෙන් සජ්ඣායනා කරයි.<br>● ධම්මපද ගාථා ගුරුකොට, ජීවිතය සාර්ථක කර ගනියි.<br>● නිවැරැදි දිවියකට මග සලසා ගනියි. | 49 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6. බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින්, යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි. | 6.1 කායානුපස්සනා භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරයි. | කායානුපස්සනාව, අනිත්‍යතාව. | • කායානුපස්සනා භාවනාවේ මූලිකාංග පැහැදිලි කරයි.<br>• ජීවිතයේ ඇති අනියත බවත්, මරණයේ ඇති නියත බවත් පිළිගනියි.<br>• කායානුපස්සනා භාවනාවේ යෙදෙයි.<br>• නිසරු දෙයෙහි ආදීනව දක්වයි.<br>• සරු දෙය පිළිගනියි. | 13 |
| | 6.2 සතිමත් ව කටයුතු කර, තම ජීවිතය සාර්ථක කරගැනීමට මග සලසා ගනියි. | සතිමත් බව | • සතිමත් ව වැඩකර, ජීවිතය සාර්ථක කරගන්නා අයුරු විස්තර කරයි.<br>• ජීවිතය සාර්ථක කර ගැනීමට, සතියෙන් වැඩකළ යුතු බව පිළිගනියි.<br>• සිහියෙන් වැඩකිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තු ගතකරයි.<br>• කාල කළමනාකරණයෙන් කටයුතු කරයි.<br>• සිතා විමසා බලා කටයුතු කරයි. | 06 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1 පාඩම
# තිලොවග බුදු පදවි ලබති

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා බෝසත් චරිතයෙහි සුවිශේෂ සිදුවීම් හැඳිනගෙන චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.1**

- බෝසත් චරිතයෙහි සුවිශේෂ සිදුවීම අධ්‍යයනය කර චරිතායනය කරයි.

**03. කාලච්ඡේද :-** 06 යි

**04. ඉගෙනුම් පල :-**

- බෝසත් චරිතයෙන් පැහැදිළිවන ගුණ විස්තර කරයි.
- බෝසත් චරිතය ආදර්ශයෙන් පිරී ඇති බව පිළිගනිමින් කථා කරයි.
- "අනේක ජාති සංසාරං" .......... යන ගාථාව කට පාඩමෙන් තාලයකට සජ්ඣායනා කරයි.
- අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරයි.
- බෝසත් දිවියක් ගත කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- පළමු පාඩම වන "තිලොවග බුදු පදවි ලබති" යන පාඩම හොඳින් අධ්‍යයනය කර පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම අංක I හි සඳහන් ඡායාරූපය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. (ගුණාත්මක යෙදවුමේ ඇත.)

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද හයකට (06) ප්‍රමාණවත් ලෙස කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- ඔවුන් කියවූ පාඩම සිසුන් අතර සාකච්ඡාවක් ගොනු කිරීමට මඟ පෙන්වන්න.
- සිසුවා කියවූ කොටස පැහැදිලි කරමින් ප්‍රශ්නෝත්තර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙවන්න.
- පාඩමේ ඇතුළත් ගාථා නිවැරැදිව උච්චාරණය කරමින් සිසුන්ට කීප සැරයක් කියා දෙන්න.
- චතුරංග සමන්නාගත වීරියය-ජයොහි බුද්ධස්ස-අනේක ජාති සංසාරං යන ගාථා එක් දිනයකට එක බැගින් කට පාඩම් ගන්න (අධ්‍යයනය කරවන්න)

- පාඩමේ අන්තර්ගත අත්‍යවශ්‍ය විෂය කරුණු සටහනක් ලෙස සංක්ෂිප්තව ලබා දෙන්න.
- ගාථා හා තේරුම් අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- දුරවබෝධ වචන පොතේ සටහන්කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම වචනවල සරල අර්ථය කියා දී ලියවන්න.
- දුරවබෝධ වචන එකතු කර කුඩා පොතක් සැකසීමට උපදෙස් දෙන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- නේවසඤ්ඤානාසඤ්ඤායතන - අරූප ලෝකයේ ඉපදීමට හේතු වන අරූප ධ්‍යාන හතරෙන් හතරවන ධ්‍යානයයි
- අත්තකිලමතානු යෝගය - තම සිරුරට මිනිසෙකුට විඳිය නොහැකි තරම් උපරිම දුක් දෙමින් සත්‍ය සෙවීම
- උඩු ගං බලා - ගඟ දිගේ ඉහළට යෑම
- පුබ්බේ නිවානුස්සති ඥානය - පෙර ආත්මභාවයන් පිළිබඳ තොරතුරු දැකීමේ නුවණ
- චුතුපපාත ඥානය - දිබ්බචක්ඛු ඥානය - සෙසු සත්වයන්ගේ ඉපදීම, මියයාම, සුගතිය, දුගතිය පිළිබඳ තොරතුරු දැකීමේ නුවණ

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම I - දස බිම්බර මාර සෙනඟ බුදුන් වහන්සේට කරදර කළ අයුරු ඇතුළත් චිත්‍රය
- පෙළ පොතේ පළමුවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- අදාළ ගාථා හා ඡේද නිවැරැදිව සජ්ඣායනය කිරීම හා කට පාඩමෙන් කීම.
- "අනේක ජාති සංසාරං....." යන ගාථාවේ සරල අර්ථය පැහැදිළි කිරීම.
- චතුරංග සමන්නාගත වීර්ය යනු කුමක්දැයි පැහැදිළි කිරීම.
- වසවත් මරු වැස්සවූ බිහිසුණු වර්ෂා නවය නම් කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- බුද්ධ චරිතය (පොල්වත්තේ බුද්ධ දත්ත නාහිමි)

# 2 පාඩම
# සත් සතිය ගෙවුණු හැටි

## 01. නිපුණතාව :- 1.0

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

## 02. නිපුණතා මට්ටම :- 1.1

- බුද්ධ චරිතයේ සුවිශේෂ සිදුවීම අධ්‍යයනය කර චරිතායනය කරයි.

## 03 කාලච්ඡේද :- 07 යි

## 04. ඉගෙනුම් පල :-

- බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කළ අයුරු පැහැදිලි කරයි.
- කළගුණ සැලකීම අගය කරමින් කථා කරයි.
- "පඨමං බෝධි පල්ලංකං".......... යන ගාථාව තාලානුරූපව මතකයෙන් සජ්ඣායනා කරයි.
- කළගුණ සලකමින් ජීවත් වෙයි.
- පිළිවෙළකට වැඩ කරයි.

## 05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-

I පෙර සූදානම,

- සත්සතිය ගෙවුණු හැටි පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේදී සිසුන්ව දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම I හි ඇතුළත් ගාථාව ලියූ පුවරුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සත්සතිය ඇතුළත් ගාථාව තාලානුරූපව සජ්ඣායනය කරන්න. සිසුන් සමග සජ්ඣායනය කරන්න. ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කර ප්‍රශ්න නගමින් පිළිතුරු ලබා ගෙන සත් සතිය යන්න ඉස්මතු කරගන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- කාලච්ඡේද හතකට (07) ප්‍රමාණවත් ලෙස පාඩම කොටස් කර ගන්න.
- එක් කාලච්ඡේදයකට එක් සතියක සිදුවීමක් විස්තර කරන්න.
- පාඩම කොටස් වශයෙන් සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- ප්‍රශ්නෝත්තර මතුකරමින් සිසුවා කියවූ කොටස් පැහැදිලි කරමින් සාකච්ඡාවක නිරත වන්න.
- එක් එක් සතියේ සිදු වූ වැදගත් සිදුවීම් පිළිබඳ අභ්‍යාසයන්හි සිසුන් යොදවන්න.
- පාඩමේ ඇති දුරවබෝධ වචන අභ්‍යාස පොතේ ලියා ගැනීමට අවස්ථාව දෙන්න.
- එම දුරවබෝධ වචනවල අර්ථය සරලව සිසුන්ට කියා දී සටහන් කිරීමට අවස්ථාව දෙන්න.

- පාඩමේ අන්තර්ගතය පිළිබඳ සරල පැහැදිලි සටහනක් සිසුන්ට ලබා දෙන්න.
- කුමන හෝ ඉගෙනුම් උපකරණයක් භාවිතා කරමින් සිසුන් ඉගෙන ගත් විෂය කරුණු ඇගයීමට ලක් කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව සිසුන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- යමක මහා ප්‍රාතිහාර්ය යනු බුදු සිරුරේ ඇති එක් රෝම කූපයකින් ගිනි කඳක් ද තවත් රෝම කූපයකින් ජල කඳක් ද එකවර සිරුරින් පිටවීම.
- රතනාඝර චෛතිය - රුවන් ගෙයයි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ දෙවන පාඩම
- ඇමුණුම I - පඨමං බෝධි පල්ලංකං...... යන ගාථාව ලියූ පුවරුවක්
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- අදාළ ගාථාව නිවැරැදිව කට පාඩමෙන් සජ්ඣායනය කිරීම.
- උද්ධෘත පාඨයක් ලබා දී ........ කවුරුන් විසින් කවරෙකුට කියන ලද්දක්දැයි විමසීම.
- බුදු සසුනේ ද්වේවාචික උපාසකයන් නම් කිරීම.
- සත් සතියේ ඔබ වඩාත්ම සිත්ගත් සතිය චිත්‍රයට නගන්න.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- අභිධර්මාර්ථ සංග්‍රහය
  (පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි)

ඇමුණුම (1) :

'පඨමං බෝධි පල්ලංකං - දුතියංඤ්ච අනිම්මිසං
තතියං චංකමණං සෙට්ඨං ...........'

# 3 පාඩම
# පස්වග තවුසන් සොයා යාම

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.1**

- බුද්ධ චරිතයේ සුවිශේෂ සිදුවීම අධ්‍යයනය කර චරිතායනය කරයි.

**03. කාලච්ඡේද :-** 07 යි

**04. ඉගෙනුම් පල :-**

- බුදුන් වහන්සේට පස්වග තවුසන් හමුවීම විස්තර කරයි.
- කළගුණ සැලකීම අගය කරමින් කථා කරයි.
- සහම්පති මහා බ්‍රහ්මයා බුදුන් වහන්සේට කළ ආරාධනයේ වටිනාකම අගයමින් කථා කරයි. "අහංහි අරහා ලොකේ" යන ගාථාව කඩ පාඩමෙන් කියයි.
- කළගුණ සලකමින් කටයුතු කරයි.
- පරාර්ථකාමීව ජීවත් වෙයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පසුවග තවුසන් සොයා යාම යන පාඩම කියවාගෙන එන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- ඇමුණුම I හි සඳහන් ගාථාව ලියූ පුවරුව සිසුන්ට ඉදිරිපත් කරන්න. ගාථාව සජ්ඣායනය කරන්න. සිසුන් සමග ද සජ්ඣායනය කරන්න. (ගුණාත්මක යෙදවුමේ ඇත.)
- බුදුරජාණන් වහන්සේ තමන් අවබෝධ කරගත් ධර්මය මුලින්ම දේශනා කළේ කාහට ද යන ප්‍රශ්නය අසමින් පස්වග තවුසන් සොයා යාම ඉස්මතු කර ගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලච්ඡේද හතකට (07) ප්‍රමාණවත් ලෙස පාඩම කොටස් කර ගන්න.
- ඡේද වශයෙන් වෙන් කොට පාඩම කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දී ප්‍රශ්නෝත්තර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙවන්න.
- "සබ්බාභිභූ සබ්බ විදූ හමස්මි - අහංහි අරහා ලොකෙ" යන ගාථා උච්චාරණය විධි සහිතව සිසුන්ට කියා දෙන්න.
- එම ගාථා අභ්‍යාස පොතේ ලිවීමට උපදෙස් දෙන්න.
- ගාථාවල අර්ථය පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙවන්න. අභ්‍යාස පොතේ ලියවන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

- පාඩමේ අන්තර්ගතය සරලව සිසුන්ගේ වචනයෙන් සටහන් පොතේ ලිවීමට උපදෙස් දෙන්න.
- එසේ ලියන ලද සටහන් ගෙන ඉන් එක් එක් සටහන්වල ඇති සංවර්ධනය විය යුතු තැන් සාකච්ඡා කර නිවැරදි කිරීම් කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- මිගදාය - මුවන්ට අභය දානය දුන් ස්ථානය.
- සිව්පසය - චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය
- පා සිවරු ගැනීම - පාත්‍රය හා සිවුර පිළිගැනීම
- ආවුසෝ - ශාසනික සම්ප්‍රදායට අනුව මහණ උපසම්පදාවෙන් වයස අඩු කෙනෙකු අමතන වචනයකි. (ඇවැත්නි)

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම I - "සබ්බාභිභූ සබ්බවිදූ හමස්මි"......... යන ගාථාව ලියූ පුවරුව
- පෙළ පොතේ තුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- අදාළ ගාථා හා ජේද නිවැරැදිව සජ්ඣායනය කිරීම.
- බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාවට සහභාගිවූ පිරිස නම් කිරීම.
- "සබ්බාභිභූ සබ්බ විදූ හමස්මි..." යන ගාථාවේ සරල අර්ථය මතකයෙන් ලියවීම.
- "අහංහි අරහා ලොකෙ..." යන ගාථාව මතකයෙන් සජ්ඣායනය කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- අරිය පරියෙසන සූත්‍රය - මජ්ඣිම නිකායේ
  ඕපම්ම වග්ගය (ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා)

ඇමුණුම (1) : 1

"සබ්බාභිභූ සබ්බවිදූ හමස්මි..."
යන ගාථාව සම්පූර්ණ කරන්න.

# 4 පාඩම
# මංගල ධර්ම දේශනය

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශනය සිදුවූ ආකාරය දැන ආදර්ශයෙන් කටයුතු කරයි.

**03. කාලච්ඡේද :-** 04 යි

**04. ඉගෙනුම් පල :-**

- ශාසනික මෙහෙවරේ ආරම්භය සිදුවූ අයුරු පැහැදිළි කරයි.
- ධර්මදූත සේවාව ක්‍රමයෙන් විකාශය වූ බව පිළිගනිමින් කථා කරයි.
- ප්‍රථම ධර්ම දූත කණ්ඩායම ලැයිස්තු ගත කරයි.
- කළගුණ සැලකීමෙන් කටයුතු කරයි.
- අන් අයට උදවු කරයි.

**05. පාඩම් සැලසුම සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- මංගල ධර්ම දේශනය පාඩම හොඳින් කියවා එන ලෙස සිසුන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම I හි දැක්වෙන පස්වග මහණුන්ට ධර්මය දේශනා කරන ඡායාරූපයක් පෙන්වා මෙම ඡායාරූපයෙන් කියවෙන්නේ කුමක්ද යන්න සාකච්ඡා කර ප්‍රශ්න නගමින් පිළිතුරු ලබා ගෙන මංගල ධර්ම දේශනය යන්න ඉස්මතු කර ගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද හතරකට (04) ප්‍රමාණවත් ලෙස කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- සිසුවා කියවූ කොටස පැහැදිලි කරමින් ප්‍රශ්නෝත්තර මතුකරමින් සාකච්ඡාවක් මෙහෙවන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- අත්හල යුතු අන්ත දෙක, ආර්ය සත්‍යය හතර, මාර්ග අංග අට (8) අර්ථ සහිතව කට පාඩම් කරවා අභ්‍යාස පොතේ ලියවන්න.
- තක්සේරුකරණ නිර්ණායක සහ ඇගයීම් ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

- පාඩමේ සඳහන් චතුරාර්ය සත්‍ය හා අර්ය අෂ්ටාංගික මාර්ගය සඳහන් කොටස් වෙන වෙනම ලියා ඒවායේ අර්ථය සරලව ලියන්න මඟ පෙන්වන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ඒහි භික්ඛු පැවිද්ද - බුදු කෙනෙකුන් විසින් "මහණ මෙහි එන්න බඹසර හැසිරෙන්නැයි" වදාළ සැණින් පැවිද්ද හා උපසම්පදාව හිමිවීම
- අනත්ත ලක්ඛණ සූත්‍රය - ත්‍රිලක්ෂණ ධර්ම පිළිබඳ විග්‍රහයකි. පස්වග භික්ෂූන් වහන්සේ රහත් වූයේ මෙම සූත්‍රය ඇසීමෙනි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ හතරවන පාඩම
- පස්වග තවුසන්ට ධර්මය දේශනා කරන අවස්ථාව ඇතුළත් පින්තූරයක්
- පිරුවාණා පොත් වහන්සේ
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- අදාළ ගාථා හා ජේද නිවැරැදිව මතකයෙන් සජ්ඣායනය කිරීම.
- අත්හල යුතු අන්ත දෙකෙහි සරල අර්ථය පැහැදිලි කිරීම
- භික්ෂු ශාසනයේ ආරම්භවීම සිදුවූයේ කෙසේදැයි සරලව පැහැදිලි කිරීම.
- "කළගුණ සැලකීමේ අගය" යන මැයෙන් කථාවක් කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චතුරාර්ය සත්‍යය
  (පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි)

ඇමුණුම 1 :

- බුදුරජාණන් වහන්සේ විසින් පස්වග තවුසන්ට ධර්ම දේශනා කරන ඡායාරූපයක් ප්‍රදර්ශනය කරන්න.

# 5 පාඩම
# බුදු සසුනේ ප්‍රථම ධර්ම දූත මෙහෙවර ඇරඹෙයි

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශය සිදුවූ ආකරය දූන ආදර්ශයෙන් කටයුතු කරයි.

**03. කාලච්ඡේද :-** 06 යි

**04. ඉගෙනුම් පල :-**

- ශාසනික මෙහෙවරයෙහි ආරම්භය සිදුවූ අයුරු විස්තර කරයි.
- ධර්ම දූත සේවාව ක්‍රමයෙන් විකාශය වූ බව අගයමින් කථා කරයි.
- ප්‍රථම ධර්මදූත කණ්ඩායම ලැයිස්තු ගත කරයි.
- අන්‍යයන්ට උදවු කරයි.
- ලෝක ශාසනික මෙහෙවරයෙහි යෙදෙයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- බුදු සසුනේ ප්‍රථම ධර්ම දූත මෙහෙවර ඇරඹෙයි පාඩම හොඳින් කියවා එනලෙස සිසුන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රාවකයන් වහන්සේලා වැඩම කරවන අයුරු ඇතුළත් පින්තූරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූරයෙන් කියවෙන්නේ කුමක් ගැනද යන්න සාකච්ජා කරමින් පාඩම ආරම්භ කරන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද හයට (06) ප්‍රමාණවත් පරිදි පාඩම කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය...." යන පාඨය සිසුන්ට කියවීමට හුරු කරන්න.
- "චරථ භික්ඛවේ චාරිකං....." යන පාඨයේ අදහස පැහැදිලි කර දෙන්න.
- එම පාඨය කොටස් දෙකකට බෙදා කට පාඩම් කරවන්න. එම කොටස අභ්‍යාස පොතේ ද ලියවන්න.
- පාඩමේ සඳහන් දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන්න.

- ඒ ඒ සිසුන් කියවූ කොටස් පැහැදිළි කරමින් ප්‍රශ්නෝත්තර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත - නිවැරැදි පද, වාක්‍ය, උච්චාරණ සහිත
- මිරිවැඩි සඟල - පාවහන් යුගල
- තේවාචික - බුදුන්, දහම්, සඟුන් සරණ යාම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළ පොතේ පස්වන පාඩම
- ඇමුණුම I බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ශ්‍රාවකයන් වහන්සේලා වැඩමකරවන අයුරු ඇතුළත් පින්තූරය
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- "චරථ භික්ඛවේ චාරිකං"..... යන පාඨය සහ එහි අර්ථය කට පාඩමෙන් සජ්ඣායනය කිරීම.
- ප්‍රථම රහතන් වහන්සේලා හැට (60) නම නම් කිරීම
- යස කුල පුත්‍රයාගේ මිතුරන් හතරදෙනා නම් කරන්න.
- යස කුල පුත්‍රයාද .................. පැවිදි උපසම්පදා කළ සේක (හිස්තැනට සුදුසු වචනය යොදන්න)

## 10. වැඩිදුර පරිශීලනයට :-

- බුද්ධ චරිතය
  (පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි)

# 6 පාඩම
# දහම එතෙර මෙතෙර පැතිර යයි

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම:- 1.2**

- බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශය සිදුවූ ආකරය දන ආදර්ශයෙන් කටයුතු කරයි.

**03. කාලච්ඡේද :-** 05 යි

**04. ඉගෙනුම් පල :-**

- ධර්ම දූත සේවාව ක්‍රමයෙන් විකාශය සිදුවූ අයුරු පැහැදිළි කරයි.
- බුද්ධ චරිතය පරමාදර්ශයන්ගෙන් පිරී ඇති බව පිළිගනිමින් කථා කරයි.
- භද්දවග්ගිය කුමාරවරුන්ගේ සිට උපතිස්ස කෝලිත දක්වා ධර්මදූත පිරිස ලැයිස්තු ගත කරයි.
- ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදෙයි.
- දාන, ශීල, භාවනා ආදී පිංකම් සිදුකරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- දහම එතෙර මෙතෙර පැතිර යයි පාඩම හොඳින් කියවා එන ලෙස පෙර දින සිසුන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම I හි ඇතුළත් චිත්‍රය සිසුන්ට ඉදිරිපත් කර එහි ඇතුළත් සිතුවමින් කියැවෙන දේ විමසා ප්‍රශ්න කර පිළිතුරු සපයමින් සාකච්ඡාවක් මෙහෙයවා දහමෙහි පැතිරීම ඉස්මතු කරන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- මෙම පාඩම සඳහා කාලච්ඡේද පහක් (5) වෙන්කර ගත හැකිය.
- පාඩමේ අන්තර්ගතය කොටස් 5 කට වෙන්කර ගන්න.
  - භද්දවග්ගිය කුමාරවරුන් නමක් ගැන සෙවීම යන කොටස පෙර පාඩමක් සමග ගලපා ප්‍රවේශය හොඳින් සිදු කරන්න.
  - ජටිලයෝ දමනය කරන ලද කොටස කථාව, කියවීම සහිතව දෙවන කාලච්ඡේදය යොදවා ගන්න.
  - තෙවන කාලච්ඡේදය සඳහා පළමු ලංකාගමනය මාතෘකාව කර ගන්න. ප්‍රවේශය ඇතිව කියවීම සමඟ පාඩම සංවර්ධනය කරගන්න.

- සිව්වන කොටස බුදු සසුනේ පළමු ආරාම පූජාව ගැන සාකච්ඡා කරන්න. අනෙකුත් ආරාම පූජා ගැන සැසඳීමක් කරන්න.
- පස්වන කාල පරිච්ඡේදය උපතිස්ස කෝලිත යහලුවන්ගේ සසුන් ගත වීම ගැන සාකච්ඡා කරන්න.

- සෑම දිනකම එක් එක් කොටසට ප්‍රශ්නෝත්තර ක්‍රමය හෝ සාකච්ඡා ක්‍රමය හෝ ප්‍රදර්ශන ක්‍රමය හෝ යොදා ගෙන ආකර්ශනීය ප්‍රවේශයක් ගන්න.
- පාඩම සංවර්ධනය කරවිට දුරවබෝධ වචන සුවිශේෂී කොටස පහදා දී ඒවායේ සරල අර්ථය ලියා ගැනීමට සලස්වන්න.
- එක් එක් කාලච්ඡේදයට අවශ්‍ය පාඩම් සාරාංශයක් ද අභ්‍යාස පොතේ සටහන් කරවන්න.
- පාඩම මුල සිට අග දක්වාම සෑම දිනකම කුමන හෝ ඉගැන්වීමේ ක්‍රම ශිල්පයක් යොදා ගෙන නොකඩවා තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- පාඩම අවසානයේ වාචික හෝ ලිඛිත සාධක පරීක්ෂණයක් කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ජටිල - ජටා දැරූ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් තාපස පිරිසකි.
- ගිනිහල්ගෙය - ජලය උණු කිරීම සඳහා ලිප් බැඳි ගෙය.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම I යක්ෂ ගෝත්‍රිකයන් දමනය කළ සිද්ධිය ඇතුළත් චිත්‍රය
- පෙළ පොතේ හයවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක :-

- “යේ ධම්මං හේතුප්පභවා”……... යන ගාථාව අර්ථ සහිතව කට පාඩමෙන් කීම
- තුන්බෑ ජටිලයන්ගේ ශ්‍රාවක පිරිස කොපමණදැයි පැහැදිලි කිරීම
- බිම්බිසාර රජතුමා අමනුෂ්‍යයන් නිසා ලද අත්දැකීම පැහැදිලි කිරීම
- භද්දවග්ගිය කුමාරවරුන්ගේ සිට උපතිස්ස කෝලිත දක්වා ධර්මදූත පිරිස ලැයිස්තුගත කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- තිරෝකුඩ්ඩ සූත්‍රය (ඛුද්දක පාඨ)

# 7 පාඩම
# උපන් ගමට වැඩම වීම

**01. නිපුණතාව :- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බුද්ධ ශාසනික මෙහෙවර ආරම්භය හා විකාශය සිදු වූ ආකාරය දැන, ආදර්ශයෙන් කටයුතු කරයි.

**03. කාලච්ඡේද :-** 5 යි

**04. ඉගෙනුම් පල :-**

- ශාසනික මෙහෙවරෙහි ආරම්භය සිදු වූ අයුරු පැහැදිලි කරයි.
- ධර්ම දූත සේවාව ක්‍රමයෙන් විකාශය වූ බව පිළිගනිමින් කථා කරයි.
- ප්‍රථම ධර්ම දූත කණ්ඩායම ලැයිස්තු ගත කරයි.
- කළගුණ සැලකීමෙන් කටයුතු කරයි.
- අන්‍යයන්ට උදව් කරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- 7 පාඩම කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ සිසුන් දැනුවත් කරන්න. එහි සඳහන්

"අඞ්ගාරිනොදානි දුමා භදන්තෙ
එලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තො ව පභාසයන්ති
සමයො මහා වීර භගීරථානං"

යනගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන් බුදුරජාණන් වහන්සේ පිරිවර සමඟ වඩින දර්ශනයක් ඇතුළත් පුවරුව ප්‍රදර්ශනය කරමින්, ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මෙම පාඩමින් බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක් ඉස්මතු වේ ද ? කළගුණ සැලකීම පිළිබඳ සාකච්ඡා කරමින් ඥාති සංග්‍රහය, පරෝපකාරය, කරුණාව යන ගුණ ඉස්මතු කර ගැනීමට සිසුන් මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේදවලට අනුව අන්තර්ගතය වෙන් කරගන්න.
- බුද්ධ චරිතයෙන් විද්‍යාමානවන ගුණ පැහැදිලි කරන්න.
- බුද්ධ චරිතය ආදර්ශයෙන් පිරී ඇති බව සාකච්ඡා කරන්න.

- "බුද්ධ චරිතය ජීවිතාදර්ශ සපයයි" යන මැයෙන් රචනාවක් කරවන්න.
- ශාක්‍ය මානය දුරු කිරීමට යෙදූ උපක්‍රම ගැන සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- වෙස්සන්තර, සඳකිඳුරු ජාතක කථා ගැන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සියලු බුදුවරුන් වංශවල පිණ්ඩපාතයෙහි වැඩි බව සාකච්ඡා කරන්න.
- "උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය" ගාථාව කටපාඩම් ගන්න.
- එහි අර්ථය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පති භක්තිය යන මැයෙන් කථාවක් කිරීමට උපදෙස් දෙන්න.
- මානය දුරු කිරීම සැනසිල්ලට හේතුවන බව සාකච්ඡා කරන්න.
- ජාතක කථා බෝසතාණන් වහන්සේගේ පෙර භවයන් පිළිබඳ සඳහන් කරන බව පවසන්න.
- ඥාති සංග්‍රහය ආධ්‍යාත්මික සුවයට අදාළ ව කළ යුතු බව විස්තර කරන්න.
- තක්සේරුකරණ නිර්ණායකවලට අදාළ ව තක්සේරුකරණය කරන්න.
- ප්‍රතිපෝෂණ අවශ්‍ය සිසුන් සුදුසු ක්‍රියාවලියක යොදවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

| | | |
|---|---|---|
| පතිවත | - | තම ස්වාමි පුරුෂයා වෙනුවෙන් ම කළ යුතු වත් පිළිවෙත ඇතිව ජීවත්වීම |
| අනුමෙවෙනි | - | අනු + මෝදනා - අනුව සතුටු වීම. |
| මානය | - | මැන බැලීම - සෙය්‍ය මාන, සදිස මාන, හීන මාන (අවමාන) |

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 1 - බුදුරජාණන් වහන්සේ පිරිවර සමග වඩින චිත්‍රය දැක්වෙන පුවරුව
- පෙළපොතේ හත්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ගාථා සජ්ඣායනා කිරීමේ දී නිවැරැදි ව උච්චාරණය
- ගාථාවේ සරල අදහස
- කළගුණ සැලකීමේ වටිනාකම
- අන්‍යයන්ට උදව් කිරීම පිළිබඳ කථාවක් පැවැත්වීමට උපදෙස් දීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

ඇමුණුම 1 - චිත්‍රය

- පන්සිය පනස් ජාතක පොතෙහි 539 වෙස්සන්තර ජාතකය, 477 වන සඳකිඳුරු ජාතකය
- බුදුගුණ අලංකාරය
- අරහං, සම්මා සම්බුද්ධො, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ, පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ, භගවා

# 8 පාඩම
# සිවුවනක් පිරිස සපිරෙයි

**01. නිපුණතාව :- 1.0**

- භික්ෂු ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, තම ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 05 යි

**04. ඉගෙනුම් පල :-**

- අදාළ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත විස්තර කරයි.
- ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තම ජීවිතයට ආදර්ශ සපයන බව පිළිගනිමින් කටයුතු කරයි.
- ශ්‍රාවක ශ්‍රාවිකා චරිත කීපයක් ඇසුරින් මතුවන ආදර්ශ වගුගත කරයි.
- ශ්‍රද්ධා සිතින් කටයුතු කරයි.
- අන් අයට ආදර්ශවත් වෙයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- "සිව්වණක් පිරිස සපිරෙයි" යන 8 වන පාඩම පෙරදින කියවා පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න. එම චරිත ගැන තොරතුරු මතකයෙහි තබාගෙන එන ලෙස ද පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන් "චක්කවරංකිත රත්තසුපාදො" ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින්, ශබ්ද නගා නිවැරැදිව සජ්ඣායනා කර, සිසුන් සමග ගායනා කරන්න. ඉන්පසු ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- මෙම ගාථාවේ අදහස කුමක්ද ? උතුම් වූ සක් ලකුණුවලින් යුතු, සිරිපා යුවලක් ඇති, දිගු විලුම් ඇති, සෙමෙර සිරිද සේසත් ආදී මංගල ලක්ෂණයන්ගෙන් ශෝභමාන වූ පා ඇති අර එන නර ශ්‍රේෂ්ඨයා ඔබේ පියාණෝය යන්න සාකච්ඡාවට බඳුන් කරන්න.
- ප්‍රශ්න නඟා පිළිතුරු ලබා ගනිමින් සිව්වණක් පිරිස මාතෘකාවට යන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද 5 වෙන් කර ගන්න.
- නන්ද කුමරුගේ ඥාති සම්බන්ධතාව පහදන්න.
- රාහුල කුමරුට පවරා දුන් පිය උරුමය සාකච්ඡා කරන්න.
- දෙව්දත් කුමරුගේ සසුනට පිවිසීම කෙසේ සිදුවී දැයි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නන්ද, රාහුල, දෙව්දත් ආදී චරිත ගැන අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කාන්තාවන්ටත් ශාසනික උරුමය ලැබිය හැකි දැයි විවාදයක් කරවන්න.
- චරිත කථා එකතුවක් ග්‍රන්ථයක් ලෙස සැකසීමට උපදෙස් දෙන්න.
- නරසීහ ගාථා එක බැගින් වන පොත් කිරීමට යොදවන්න.
- දැඩි අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් කෙළෙස් සමනය කළ හැකි බව පහදන්න.
- භෞතික වස්තුවලට වඩා සිය උරුමය වන්නේ ආධ්‍යාත්මික ජීවිතය බව විස්තර කරන්න.
- සිත තුළින් ම උස් පහත් ගති ඇතිවන බව සාකච්ඡා කරන්න.
- තණ්හාව නිසා දුර්විපාක ඇතිවන බවත්, අත හැරීමෙන් සුවදායක බව ඇතිවන අයුරුත් විස්තර කරන්න.
- දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකළ යුතුය යන බුද්ධ නියමය පැහැදිලි කරන්න.
- නිර්ණායකවලට අදාළව සිසුන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- කරනවෑමියා - කෙස් කපන්නා (බාබර්)
- සුළු මව - මවගේ නැගණිය එනම් පුංචි අම්මා (දෙවෙනි මව)
- උපසම්පදාව - සාමණේර පැවිද්දෙන් පසු 20 වයස් සම්පූර්ණ වූ පසු කෝටියක් සංවර සීලය සහිත අධිසීල සංඛ්‍යාත උපසම්පදාවට පත් කරනු ලබයි. ඒ සඳහා අදාළ බණ දහම් සම්පූර්ණ කළ යුතු වෙයි. සසුනේ උරුමය ලැබෙන්නේ එවිටය.

- චිරරාත්‍රඥ - පැවිදිව බොහෝ කල් ගත වූ

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 1

- "චක්කවරංකිත රත්තසුපාදෝ " ගාථාව ලියන ලද පුවරුව
- පෙළපොතේ අටවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- නන්ද කුමරුගේ චරිතය විස්තර කිරීම.
- බාහිර වස්තු කෙළෙස් වැඩි කිරීමට හේතුවන බව පැහැදිලි කිරීම.
- යහපත් චරිත ආදර්ශයට ගැනීම අවධාරණය කිරීම.
- සසර දුකින් නිදහස් වීම පරම සැපත ලෙස සිතා කටයුතු කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

ඇමුණුම 1

1. චක්කවරංකිත රත්තසුපාදෝ - ලක්ඛණමණ්ඩිත ආයත පණ්හි
   චාමර ඡත්ත විභූසිත පාදෝ - ඒසහි තුය්හ පිතා නරසීහෝ

2. සක්‍ය කුමාරවරෝ සුඛුමාලෝ - ලක්ඛණවිත්තිත පුණ්ණ සරීරෝ
ලෝක හිතාය ගතෝ නරවීරෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

3. පුණ්ණ සසඞ්කනිභෝ මුඛවණ්ණෝ - දේවනරානපියෝ නරනාගෝ
මත්තගජින්ද විලාසිතගාමී - එසහි තුය්හ පිතා නරසීහෝ

4. ඛත්තිය සම්භව අග්ගකුලීනෝ - දේවමනුස්ස නමස්සිතපාදෝ
සීලසමාධි පතිට්ඨිත චිත්තෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

5. ආයතතුංග සුසණ්ඨිත නාසෝ - ගෝපඛුමෝ අභිනීල සුනෙත්තෝ
ඉන්දධනු අභිනීලභමුකෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

6. වට්ටසුමට්ට සුසණ්ඨිත ගීවෝ - සීහහනුමිගරාජ සරීරෝ
කඤ්චන සුච්ඡවි උත්තමවණ්ණෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

7. ස්නිද්ධ සුගම්භිර මඤ්ජුසුඝෝසෝ - හිංගුල බද්ධසුරත්ත සුජිව්හෝ
වීසති වීසති සේත සුදන්තෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

8. අඤ්ජන වණ්ණ සුනීලසුකේසෝ - කඤ්චන පට්ට විසුද්ධලලාටො
ඕසධි පණ්ඩර සුද්ධසුඋණ්ණෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

9. ගච්ඡති නීලපථේ විය චන්දෝ - තාරගණා පරිවේඨිත රූපෝ
සාවක මජ්ඣගතෝ සමණින්දෝ - එස හි තුය්හ පිතා නරසීහෝ

# 9 පාඩම
# අග්‍ර උපස්ථායක ආනන්ද හාමුදුරුවෝ

**01. නිපුණතාව :- 1.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 1.2**

- බෞද්ධ ශ්‍රාවක චරිත අධ්‍යයනය කොට, තම ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 05 යි

**04. ඉගෙනුම් පල :-**

- අග්‍ර උපස්ථායක ආනන්ද හිමි ප්‍රධාන අදාළ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත විස්තර කරයි.
- ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තම ජීවිතයට ආදර්ශ සපයන බව පිළිගනිමින් කටයුතු කරයි.
- ශ්‍රාවක ශ්‍රාවිකා චරිත කිහිපයක් ඇසුරින් මතුවන ආදර්ශ වගුගත කරයි.
- ශ්‍රද්ධා සිතින් කටයුතු කරයි.
- අන් අයට ආදර්ශවත් වෙයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි 9 වන පාඩම කියවා, පැමිණීමට සලස්වා, ශබ්ද නගා නිවැරැදිව උච්චාරණය කර සිසුන්ට කියවීමට සලස්වන්න.ඒ පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න.

II ප්‍රවේශය

ඇමුණුම 1

- ආනන්ද හිමියන් බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරන දර්ශනයක් ඇතුළත් පුවරුව ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ප්‍රශ්න අසමින් සාකච්ඡා මෙහෙයවන්න.
- මෙහි කියැවෙන චරිතය කවුරුන් ගැන ද ? සාකච්ඡා කරමින් ආනන්ද හිමි බව ඉස්මතු කර ගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු ආකාරයට කාලච්ඡේද වෙන් කර ගන්න.
- ආනන්ද හිමිගේ පැවිදිවීමේ පුවත සාකච්ඡා කරන්න.
- ආනන්ද මහ තෙරුන් වහන්සේ ලැබූ අග තනතුර පැහැදිලි කරන්න.
- අදාළ පාඩම නිවැරැදිව, ශබ්ද නගා උච්චාරණය කරමින් කියවීමට සලස්වන්න.
- ආනන්ද හිමියන් තවත් තනතුරු දැරූ බව සාකච්ඡා කරන්න.
- ආනන්ද හිමි උපස්ථායක තනතුරට පත් වූ ආකාරය විමර්ශනය කරන්න.

- මීට පෙර උපස්ථායක තනතුරු දැරූ පිරිස නම් කරන්න.
- ආනන්ද හිමියන් ඉදිරිපත් කළ කොන්දෙසි අට කටපාඩම් කරවන්න.
- තමා සුදුස්සෙකු බවට පත් වූ විට තනතුරු තමා වෙත ලැබෙන බවට සාකච්ඡා කරන්න.
- ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තනතුරු නොගත යුතු බව විස්තර කරන්න.
- බහු ශ්‍රැත භාවයෙහි වැදගත්කමක්, පළමු ධර්ම සංගායනාවේ වගකීමක් සාකච්ඡා කරන්න.
- තනතුරක් යනු මත්වීමකට හේතු නොවන්නක් බව අවධාරණය කරන්න.
- සිතෙහි අසිරිමත් බව අනද හිමියන් තුළින් ප්‍රකට වන බව විස්තර කරන්න.
- උත්තම චරිතයක් ලෙස ආනන්ද හිමි යන මාතෘකාව යටතේ සමිතියට කථාවක් සූදානම් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන්ට ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අග තනතුර - ඉහළ ම, ප්‍රධාන ම තානාන්තරය. සසුනෙහි 80 නමක් අගතනතුරු ලැබූහ. ඒවා සියල්ලම ගුණවත්කමට ලැබූ උපහාර වෙති.

- ධර්ම භාණ්ඩාගාරික - බුදුරජාණන් වහන්සේ දෙසූ 84000 ක් ධර්මය සිතේ දරාගත් කෙනා යනුයි.

- ධර්ම සංගායනාව - විසිරී පැවතුන ධර්මය විනය, සූත්‍ර අභිධර්ම යනුවෙන් ත්‍රිපිටකයට නගා සංග්‍රහ කොට තැබීමයි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 1

- බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරන දර්ශනය ඇතුළත් පුවරුවක්.
- පෙළපොතේ නව වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ආනන්ද හිමි චරිතය විස්තර කිරීම.
- එකී චරිතයෙහි ජීවිතාදර්ශ එකතු කිරිම.
- සැදැහැයෙන් කටයුතු කිරීම.
- ආනන්ද හිමි චරිතය චරිතායනය කිරීම.
- බහුශ්‍රැත බවෙහි වටිනාකම තේරුම් ගෙන ක්‍රියා කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඇමුණුම 1
- පූජ්‍ය ගණේගම සරණංකර හිමියන්ගේ "ආනන්ද හාමුදුරුවෝ" ග්‍රන්ථය

# 10 පාඩම
# මහා ධර්මපාල ජාතකය

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.1**

- බෞද්ධ ජාතක කථාවල ජීවිතාදර්ශ ලබාගෙන තම දිවිය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 10 යි

**04. ඉගෙනුම් පල :-**

- ජාතක කථා තුළින් බෝසත් චරිතය පිළිබිඹු වන බව විස්තර කරයි.
- ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගැනීමට කටයුතු කරයි.
- ජාතක කථා කීපයක් තුළින් ආදර්ශ වගුගත කරයි.
- ජාතක කථා තුළින් යහපත් චරිත ආදර්ශ කොට ගනියි.
- සාර්ථක ජීවිතයකට මඟ සලසා ගනියි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- 10 වන පාඩම මහා ධර්මපාල ජාතකය කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න. එහි එක් ගාථාවක් වණපොත් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ධර්මපාල ජාතක කථාවේ එන චරිත ගැන විමසමින් පාඩමට පිවිසෙන්න.
- මෙම ජාතක කථාවේ අකල් වියෝග නොවීමට හේතු වූ කරුණු මතු කරගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද 10 වෙන් කරගන්න.
- ජාතක කථා ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ ග්‍රන්ථයක් බව පැහැදිලි කරන්න.
- එම ග්‍රන්ථ 15 අතුරෙන් 10 වන ග්‍රන්ථය බවත්, ජාතක 550 න් 441 වන ජාතකය බවත් සාකච්ඡා කරන්න.
- කාලච්ඡේදවලට අනුව ගාථා වණපොත් කරවන්න.
- නිදාන කථාව පහදමින් වර්තමාන කථාව සාකච්ඡා කරන්න.
- යහපත් සිතිවිලි, වචන, ක්‍රියා නිසා යහපත් දිවියක පවත්වාගෙන යා හැකි බව පහදන්න.
- ජාතක කථා තුළින් පුනර්භවය ඉස්මතු කර පෙන්වන්න.

- බාල කාලයෙහි මිය නොයෑමට, තම චර්යාව යහපත්ව පවත්වාගෙන යා යුතු බව අවධාරණය කරන්න.
- දීර්ඝායුෂ විඳීමට නම් සීලය ප්‍රබල සාධකයක් බව පහදන්න.
- ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය තුළින්ම ආරක්ෂාව ලබන බව පැහැදිලි කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක මත ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අවශ්‍ය නම් ප්‍රතිපෝෂක ක්‍රියාවලියක යොදවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- කෘශ - කෙට්ටු
- අප්‍රාණික ධ්‍යානය - හුස්ම සහමුලින්ම නවතා ධ්‍යාන වැඩීම.
- ත්‍රිවේදය - ඍග්, යජුර්, සාම
- වණිබ්බකයන් - (වාණිජ) වෙළෙන්දන්
- යදියන් - ඉල්ලාගෙන එන අය (යාචක)
- දස කුසල - සිත, කය, වචනයන්ගෙන් සිදුවන අයහපත් කරුණුවලින් වැළකී, සසර ගමන වැළකීමට සමත් කුසල කර්ම දහය

* ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකී යහපත් ක්‍රියාවල යෙදීමේ දක්ෂකම

* මුසාව, කේළම, ඵරුස, සම්ප්පපලාව ආදියෙන් වැළකි ඊට විරුද්ධ සත්‍ය ආදී වචන භාවිතය

* සිතෙන් වන අභිධ්‍යා, ව්‍යාපාද මිච්ඡාදිට්ඨියෙන් වැළකී යහපත් කරුණු ක්‍රියාවට නැංවීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- චරිතායනයක්
- පෙළපොතේ දහ වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- පහත සඳහන් නිර්ණායක යොදාගන්න.
- පාඩම නිවැරැදිව උච්චාරණය කිරීම.
- ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගැනීමට කටයුතු කිරීම.
- ජාතක කථාවල ආදර්ශ වගුගත කිරීම.
- යහපත් ජීවිතාදර්ශ ආරෝපණය කර ගැනීම.
- එමගින් සාර්ථක ජීවිතයකට මගපාදා ගැනීම.
- මිහිරි හඬින් ජාතක දේශනයක් සිදු කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- බු. ජ. ත්‍රි - ජාතක පාළිය

# 11 පාඩම
# සීල විමංස ජාතකය

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.1**

- බෞද්ධ ජාතක කථාවල ජීවිතාදර්ශ ලබාගෙන තම දිවිය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 03 යි

**04. ඉගෙනුම් පල :-**

- සීල විමංස ජාතකය තුළින් බෝසත් චරිතය පිළිබිඹු වන බව විස්තර කරයි.
- ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගැනීමට කටයුතු කරයි.
- සීල විමංස ජාතකය තුළින් ආදර්ශ වගුගත කරයි.
- යහපත් චරිත ආදර්ශ කොට ගනියි.
- සාර්ථක ජීවිතයකට මග සලසා ගනියි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම,

- 11 වන පාඩම මහා සීල විමංස ජාතකය කියවා පැමිණීමට සිසුන් දැනුවත් කරන්න. එහි සඳහන්

  සීලං කිරේව කල්‍යාණං
  සීලං ලෝකෙ අනුත්තරං
  පස්ස ඝෝර විසෝ නාගෝ
  සීලවාති න පඤ්ඤති යන ගාථාව වණපොත් කරන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන් "සීලං කිරේව කල්‍යාණං" ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් ශබ්ද නඟා, නිවැදිව සජ්ඣායනා කර සිසුන් සමග ගායනා කරන්න. ඉන්පසු ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- ගාථාවෙන් කියැවෙන අරුත කුමක්ද? සීලය වනාහි යහපත්ය සීලය උතුම් ය. බලන්න විෂඝෝර සර්පයා සීලය නිසා නො නසයි යන්න සාකච්ඡා කරමින් සීලය ඉස්මතු කරගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලය යොදා ගන්න.
- ත්‍රිපිටකයට අයත් සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15 අතුරින් දහ වැන්න ජාතක බව පහදන්න.

- එහි කථා 547 ක් අතර 85 වන ජාතකය මෙය බව පහදන්න.
- නිදාන කථාව ගැන සාකච්ඡාවක් අරඹන්න.
- සීලය ජීවිතය ආලෝකමත් කරන්නක් බව පහදන්න.
- සීලයෙහි ප්‍රභේද ගැන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සීලය යන මාතෘකාව යටතේ කථාවකට ඉඩ සලසා දෙන්න.
- සීලය යනු කවරක්දැයි පොත් පිංචක් සකස් කරවන්න.
- නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- දුරවබෝධ වචන

| | | |
|---|---|---|
| අයකැමි | - | භාණ්ඩ හා මුදල් පිළිබඳ ගනුදෙනු කරන්නා |
| පිටිතලහයා බැඳ | - | දෙ අත් පිටුපසට තබා බැඳ |
| අහිකුණ්ඨික | - | සර්ප නටවන්නා (එයින් ජීවත්වන්නා) |
| පංච අභිඥා | - | අභිඥා පස - සිත සමාධිගත කිරීමෙන් ලබා ගත හැකි දියුණු තත්ත්ව ඉද්ධිවිධ, දිබ්බසෝත, චේතෝපරිය, පුබ්බේ නිවාසානුස්සති, චුතුපපාත |

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 1

- පෙළපොතේ එකොළොස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ජාතක කථා තුළින් බෝසත් චරිත පිළිබිඹුවන බව විස්තර කිරීම.
- ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගනිමින් කටයුතු කිරීම.
- ජාතක කථාවේ ආදර්ශ වගුගත කිරීම.
- යහපත් චරිත ආදර්ශ කොට ගැනීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඇමුණුම 1

  සීලං කිරේව කල්‍යාණං
  සීලං ලෝකෙ අනුත්තරං
  පස්ස ඝෝර විසෝ නාගෝ
  සීලවාති න හඤ්ඤති

- බු. ජ. ත්‍රි - ජාතක පාළිය

# 12 පාඩම
# සෝණක ජාතකය

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගස්වා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.1**

- බෞද්ධ ජාතක කථාවල ජීවිතාදර්ශ ලබාගෙන තම ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 07 යි

**04. ඉගෙනුම් පල :-**

- සෝනක ජාතකය තුළින් බෝසත් චරිතය පිළිබිඹු වන බව විස්තර කරයි.
- ජාතක කථා බෝසත් දිවිය හා බැඳී ඇති බව පිළිගැනීමට කටයුතු කරයි.
- සෝනක ජාතකය තුළින් ආදර්ශ වගුගත කරයි.
- යහපත් චරිත ආදර්ශ කොට ගනියි.
- සාර්ථක ජීවිතයකට මඟ සලසා ගනියි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

**I** පෙර සූදානම,

- 12 වන පාඩම කියවා එන ලෙස සිසුන් දැනුවත් කරන්න. එහි පළමු ගාථාව වන

  සදාපි භද්දමනස්ස අනගාරස්ස භික්ඛුනෝ

  න තේසං කොට්ඨෙ ඕපෙන්ති න කුම්භිං න කළෝපියං

  පරනිට්ඨිතමේසානා තේන යාපෙන්ති සුබ්බතා යන මෙය කට පාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන් "සදාපි භද්දමනස්ස අනගාරස්ස භික්ඛුනෝ" යන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් එය සජ්ඣායනය කරමින් සිසුන් සමග සජ්ඣායනා කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මේ ගාථාවෙන් කියැවෙන්නේ කවර කරුණක් ගැන ද? නිර්ධන භික්ෂුවගේ ස්වරූපයයි. ඒ පිළිබඳ සාකච්ඡා කරමින් පැවිදි දිවියක වටිනාකම ඇගයීමට සිසුන් මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලඡේද වෙන් කර ගන්න.
- ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15 අතුරින් 10 වන ග්‍රන්ථය බව පහදන්න.
- එහි ජාතක අතර 521 වන ජාතකය සෝණක ජාතකය බව සාකච්ඡා කරන්න.

- මෙම ජාතකය තුළ ගාථා 8ක් ඇති බව සාකච්ඡා කරන්න.
- දිනකට ගාථා 2 ක් වණපොත් කරවන්න.
- දුරවබෝධ වචන ලියා අර්ථ දක්වන්න.
- භික්ෂු ජීවිතය යහපත් කරවන කරුණු පෙළ ගස්වන්න.
- කාමයට ගිජුවීම කෙළෙස් වසඟයට යාමක් බවත් අතහැරීම නිරාමිස ප්‍රීතියට හේතුවන බවත් පවසන්න.
- නිදාන කථාව නිවැරැදිව කියවීමට සලස්වා එහි ඇති උපමාව අභ්‍යාස පොතෙහි සටහන් කරවන්න.
- සඟගුණ දැක්වෙන ගාථාව අර්ථ සහිතව පාඩම් කරවන්න.
- නිසරු කම් සැපතට ගිජු නොවී කල් ගෙවන්නට මග පෙන්වන්න.
- තක්සේරුකරණ නිර්ණායකවලට අදාළව තක්සේරුකරණය කරන්න.
- නියමිත සාධන මට්ටම කරා ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක යොදවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ප්‍රත්‍යවේක්ෂා - නුවණින් බැලීමයි. භික්ෂු වහන්සේලා සිවුපසය පරිභෝජනය කරන විට නුවණින් බලා ඇසෙන සේ ප්‍රත්‍යවේක්ෂා වාක්‍යය කියනු ලබයි. (පටිසංඛා යෝනිසෝ පිණ්ඩපාතං පටිසේවාමි .....)
- නිර්ධන - ධනය නැති. භෞතික ධනයක් නැත. සද්ධාදී ගුණයන් ම ධනය වෙති.

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම

- පෙළපොතේ දොළොස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ගාථා සජ්ඣායනා කිරීමේ දී නිවැරැදිව උච්චාරණය කිරීම.
- නිදාන කථාව මතකයෙන් කීම.
- ගාථාවල අර්ථය සරලව පැහැදිලි කිරීම.
- ගාථා අරුත් එක්කොට පැවිදි ජීවිතයක වටිනාකම ගැන සමිතියක කථාවක් පැවැත්වීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

ඇමුණුම 1

- සදාපි භද්දමනස්ස ගාථාව සඳහන් පුවරුව
- බු. ජ. ත්‍රි - ජාතක පාළිය
- ධම්මපදට්ඨ කථාවේ චුල්ල සුභද්‍රා කථාව
- ථේරී ගාථා පාලියේ රෝහිණී කථා

# 13 පාඩම
# බුදු දහමින් රට පාලනය කළ සක්විති රජතුමා

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.3**

- බෞද්ධ උපාසක උපාසිකා චරිතවලින් මතුවන ගුණාංග හැදින ආදර්ශ සපයයි.

**03. කාලච්ඡේද :-** 06 යි

**04. ඉගෙනුම් පල :-**

- අශෝක රජුගේ චරිතය විස්තර කරයි.
- උපාසකයෙකු හෝ උපාසිකාවක වීමට නිවැරැදි ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනිමින් කටයුතු කරයි.
- බෞද්ධ උපාසක උපාසිකාවන්ට උදාහරණ සපයයි.
- උපාසකයෙකු හෝ උපාසිකාවක ලෙස කටයුතු කරයි.
- දැහැමිව ජීවත් වෙයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- 13 වන පාඩම මැනවින් කියවා පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න. එහි සඳහන් වන රජු සසුනට කළ මෙහෙය ලැයිස්තුවක් ලෙස කරුණු රැස් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන් "මමයි ධර්මාශෝක අධිරාජයා" යනුවෙන් කියමින් පන්තියේ ශිෂ්‍යයෙකු ඉදිරියට එන ලෙසට මෙහෙය වන්න. ඔහු සමග ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මෙම චරිතයෙන් කවුරු ගැන කියවේ ද ? ධර්මාශෝක අධිරාජයා යන්න සාකච්ඡා කරමින් ඔහු අධිරාජ්‍යයෙකු බව ඉස්මතු කර ගැනීමට සිසුන් මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද වෙන් කරගන්න.
- ධර්මාශෝක රජුගේ රාජ්‍ය පෙළපත ගැන සාකච්ඡා කරන්න.
- ධර්මාශෝක රජකමට පත් වූ ආකාරය සාකච්ඡා කරන්න.
- රජුගේ ජීවිත කථාව ලියාගෙන ඒමට සලස්වන්න.
- රජතුමා උපාසකයෙකු වීමට හේතු වූ කරුණ ගෙනහැර පාන්න.

- උපාසක චරිතයක් සඳහා නිවැරැදි ජීවිතය බලපාන බව පැහැදිලි කර දෙන්න.
- ධර්මය ම ගුරු කොට ගනිමින් ජීවත්වීමට හැකිවීම සියලු අභියෝගවලට විසඳුම බව පැහැදිලි කරන්න.
- දික් විජයට වඩා ධර්ම විජයෙහි අගය පහදන්න.
- පරාර්ථ චර්යාව ආත්මාර්ථකාමීත්වයට වඩා උසස් වන අයුරු සාකච්ඡා කරන්න.
- රජු සසුනේ දියුණුවට ක්‍රියා කළ අන්දම පැහැදිලි කරන්න.
- යුදයෙන් දහසක් දිනනවාට වඩා තම සිත දිනීමෙහි වැදගත්කම අගයන්න.
- රටවල් නවයෙහි සසුන් සේවය ගැන කරුණු වගුගත කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

ඇමුණුම 1 - චරිතායනය

- අටවිසි අවුරුදු - 28 ක් අවුරුදු
- ටැම්ලිපි - සිදුවීම් ගල් කණුවල කොටවා තැබූ ලිපි
- අශෝක රජු ධර්ම ප්‍රචාරය කළ රටවල් නවය - කාශ්මීර - ගන්ධාර
  මහිස මණ්ඩල
  වනවාසදේශය
  අපරන්තකය
  මහාරට්ඨ
  යෝනක
  සුවණ්ණ භූමි
  හිමවන්ත
  තම්බපණ්ණි

## 08. ගුණාත්මක යෙදවුම් :-

ඇමුණුම 1

- පෙළපොතේ දහතුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- නිවැරැදි ජීවිතයකට උපාසකත්වය බලපාන අයුරු පිළිගැනීමට කටයුතු කිරීම.
- උපාසක චරිත ඉගෙන තමා ද එලෙස ජීවත්වීමට උත්සාහ කිරීම.
- ධාර්මික ව ජීවත් වීම විස්තර කිරීම.
- යුද ජයග්‍රහණයට වඩා තම සිත දිනා ගැනීමේ වැදගත්කම අවධාරණය කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ඇමුණුම 1 - චරිතායනය
- දහම් පාසල් අවසාන විභාගය - ශාසන ඉතිහාසය

# 14 පාඩම
# බෝසත් සෙවනැල්ල වන් යසෝධරා තෙරණියෝ

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.2**

- බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, තම ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 04 යි

**04. ඉගෙනුම් පල :-**

- යශෝධරා තෙරණිය චරිතය, විස්තර කරයි.
- යශෝධරා දේවිය චරිතය තම ජීවිතයට ආදර්ශ සපයන බව පිළිගනිමින් කටයුතු කරයි.
- යශෝධරා තෙරණිය චරිතය ඇසුරින් මතුවන ආදර්ශ වගුගත කරයි.
- ශ්‍රද්ධා සිතින් කටයුතු කරයි.
- අන් අයට ආදර්ශවත් ව ජිවිතය ගතකරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- පෙළ පොතෙහි 14 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේදී ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. එහි එන යශෝධරාවත පද්‍යය කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.
- සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සහ යශෝධරා දේවියගේ අතීත භවයන් පිළිබඳ දැක්වෙන ජාතක කථා දෙක බැගින් සොයාගෙන ඒමට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- යශෝධරාවත කාව්‍යයෙහි "හිමේ ගොසින් මල් යහනක සිටිනව ද" යන කවිය තාලානුකූලව ගැයීමට සලස්වා යසෝදරාව බෝසත් සැමියාගේ සුව දුක් විමසූ ආකාරය පිළිබඳව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එම කවියෙන් පැවසෙන්නේ යසෝධරා දේවිය තුළ පවතින ස්වාමි භක්තිය පිළිබඳව යැ'යි පවසමින්, යශෝධරා තෙරණිය ගිහිකල තම ස්වාමියා පිළිබඳ සැලකිළිමත් වූ ආකාරය එම තෙරණියගේ චරිතයේ පෙර ගුණාංගය ඉස්මතුකර ගැනීමට සිසුන් මෙහෙය වන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- දීපංකර බුදුරජාණන් වහන්සේගේ සමයේ සිට වෙස්සන්තර රජතුමාගේ කාලය දක්වා බෝධිසත්ත්වයන් වහන්සේ වෙනුවෙන් අසීමිත කැපකිරීම් කළ පින්වන්තියක බව පැහැදිලි කරන්න.
- සුදුසු ලෙස සිසුන් කණ්ඩායම් කරන්න.
- සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සහ යශෝධරා දේවියගේ අතීත භවය පිළිබඳ දැක්වෙන චන්ද කින්නර ජාතක කථාව පන්තිය ඉදිරියේ පැවසීමට සිසුන් යොමු කරන්න.
- යශෝධරා තෙරණියගේ පැවිදි ජීවිතයේ සුවිශේෂ අවස්ථා පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- යශෝධරා දේවියගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ මොනවාදැ'යි සිසුන්ගෙන් විමසමින් ඒවා තම අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට යොමු කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ස්වයංවර - තමා විසින්ම ස්වාමිපුරුෂයා තෝරා ගැනීමට කාන්තාව ලබන වරය
- අභිනිෂ්ක්‍රමණය /අබිනික්මන් ් උතුම් කුසල චර්යාව සඳහා ගිහි ගෙයින් නික්ම යෑම
- අසංඛ්‍ය - ප්‍රමාණ කළ නොහැකි ඉතා දීර්ඝ කාලයක්

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම් 01- "හිමයේ ගොසින් මල් යහනක නිදනව ද" යශෝධරාවතෙහි කවිය ලියන ලද පුවරුව
- පෙළ පොතේ දහ හතරවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- පෙර භවය සඳහන් චන්ද කින්නර ජාතක කථාව මතකයෙන් කීම
- යශෝධරා දේවියගේ චරිතයේ යහගුණ ලක්ෂණ ප්‍රකාශ කිරීම
- පතිකුලයට යාමට පෙර ඇය ක්‍රියා කළ ආකාරය මතකයෙන් ඉදිරිපත් කිරීම
- අභිමතාර්ථ සාධනයට අධිෂ්ඨානය හා කැපකිරීම් අවශ්‍ය බව දැක්වීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චන්ද කින්නර ජාතකය - පන්සිය පනස් ජාතක පොත
- සඳකිඳුරු දා කව - විල්ගම්මුල සංඝරාජ මහ තෙරිඳු
- යශෝධරාවත - මහනුවර යුගය

# 15 පාඩම
# බුදු පුතුන් රකින බොදු මවුවරු

## 01. නිපුණතාව :- 2.0

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

## 02. නිපුණතා මට්ටම :- 2.3

- බෞද්ධ උපාසක උපාසිකා චරිතවලින් මතුවන ගුණාංග හැඳින, ආදර්ශ සපයයි.

## 03. කාලච්ඡේද :- 3 යි

## 04. ඉගෙනුම් පල :-

- මාතික මාතාවගේ චරිතය විස්තර කරයි.
- උපාසිකාවක වීමට නිවැරැදි ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනිමින් කටයුතු කරයි.
- බෞද්ධ උපාසක උපාසිකාවන්ට උදාහරණ සපයයි.
- උපාසකයෙකු හෝ උපාසිකාවක ලෙස කටයුතු කරයි.
- දැහැමිව ජීවත් වෙයි.

## 05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-

I පෙර සූදානම

- "බුදු පුතුන් රකින බොදු මව්වරු" පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. එහි සඳහන් "දුන්නිග්ගහස්ස ලහුනෝ"යන ගාථාව හා තේරුම කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.
- "දුන්නිග්ගහස්ස ලහුනෝ"යන ගාථාව ලියූ පුවරුවක් සකසාගන්න.

II ප්‍රවේශය

- "දුන්නිග්ගහස්ස ලහුනෝ" යන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් ගාථාව ශබ්ද නගා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමඟ එකට සජ්ඣායනය කරන්න.
- "මෙම ගාථාව දේශනා කිරීමට මුල් වූ නිමිත්ත කුමක් ද?" යන්න සාකච්ඡා කරමින් මාතික මාතාව සිත දියුණු කර අන් අයගේ අදහස් දැනගෙන ක්‍රියා කරන උපාසිකාවක බව අර්ථ ගැන්වීමට සිසුන් මෙහෙයවන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- සුදුසු පරිදි කාලච්ඡේද වෙන්කර ගන්න.
- භික්ෂූන් වහන්සේලාගේ ජීවන රටාව හැඩගසා ගැනීමට උපාසක උපාසිකාවන්ගෙන් අනුපමේය සේවයක් බුද්ධ කාලයේ සිට ම සිදුවන බව පැහැදිලි කරන්න.

- මාතික මාතාවගේ චරිතයෙන් මතුවන ගුණාංග පිළිබඳ ලැයිස්තුවක් සකසා අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- මාතික මාතාව ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කරන්නියක බව පවසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මාතික මාතාවගේ චරිතයෙන් මතුවන ආදර්ශ උපයෝගී කර ගෙන බිත්ති පුවත්පතක පළකිරීමට ලිපියක් සකසා ගෙන ඒමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සෙරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අට මහා නරකය - සංජීව,කාලසූත්‍ර,සංඝාත,තාප,ප්‍රතාප,රෞරව,මහාරෞරව, අවීචි
- ද්වත්තිංසාකරය - දෙතිස් කුණප
- විදර්ශනා - ලෝකය අනිත්‍ය ය, දුක්ඛ ය, අනාත්ම ය යනුවෙන් සැලකීම
- සිවුපිළිසිඹියා - අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාණ
- සතර කමටහන් - බුද්ධානුස්සති, මෙත්තානුස්සති, අසුභානුස්සති, මරණානුස්සති
- පුහුදුන් - සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ගලාභීත්වය නොලද (පෘථග්ජන)

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම් 01- "දුන්නිග්ගහස්ස ලහුනෝ" යන ගාථාව ලියන ලද පුවරුව
- පෙළපොතේ පහළොස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- ගාථාව කටපාඩමින් නිවැරැදිව සජ්ඣායනය කිරීම.
- මාතික මාතා පිළිබඳව ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කිරීම.
- බෞද්ධ උපාසකයෙකු සතු ගුණාංග ඉදිරිපත් කිරීම.
- දැහැමිව ජීවත් වීමේ වටිනා කම පැහැදිළි කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- මහා සතිපට්ඨාන සූත්‍රය - ආචාර්ය නාකුළුගමුවේ සිරිරතන ස්ථවිරයන් වහන්සේ

# 16 පාඩම
# සසුන් ගමනින් ලොව ම සැනසූ පොඩි හාමුදුරුවෝ

**01. නිපුණතාව :- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කර ගනියි.

**02. නිපුණතා මට්ටම :- 2.2**

- බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, තම ජීවිතය සාර්ථක කර ගනියි.

**03. කාලච්ඡේද :-** 04 යි

**04. ඉගෙනුම් පල :-**

- නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතයේ ගුණාංග අනාවරණය කරයි.
- නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ චරිතය තම ජීවිතයට ආදර්ශ සපයන බවට එකඟව තටයුතු කරයි.
- නිග්‍රෝධ සාමනේරයන් වහන්සේගේ චරිතයෙන් මතුවන ආදර්ශ ප්‍රදර්ශනය කරයි.
- සංවර සිතින් කටයුතු කරයි.
- තැනට සුදුසු නුවණින් කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- "සන්සුන් ගමනින් ලොවම සැනසූ පොඩි හාමුදුරුවෝ" පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න. එහි සඳහන් ධම්මපදයෙහි එන "අප්පමාදෝ අමත පදං" යන ගාථාව පාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- කාලිංග යුද්ධයෙන් දැඩි පීඩාවට පත්ව සිටි අශෝක අධිරාජ්‍යයා සඳලු තලයේ සිට පහත බලන විට සංවරව වඩින නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ රුව සහිත පුවරුවක් ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක් අරඹන්න.
- "අප්පමාදෝ අමත පදං" ගාථාවෙන් කියවෙන්නේ කුමක් ගැන ද? යන්න සාකච්ඡා කරමින් අශෝක අධිරාජ්‍යයා නිග්‍රෝධ සාමනේරයන් දැක පැහැදී උන්වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කොට බෞද්ධයෙකු වූ ආකාරයත් නිග්‍රෝධ සාමනේරයන් වහන්සේ ද අවස්ථානුකූලව හැසුරුණු ආකාරයත් පිළිබඳව ඉස්මතු කර ගැනීමට සිසුන් මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ජේද වෙන්කර ගන්න.
- ධර්මාශෝක රජතුමාගේ වැඩිමහල් සොහොයුරු සුසීම හා ඔහුගේ බිරිඳ වන සුමනා දේවියගේ දරුවා වන නිග්‍රෝධ කුමරු සැඩොල් ගමකදී උපත ලැබූ බව පැහැදිලි කරන්න.

- සැඩොල් ගමේදී මුණ ගැසුණු "වරුණ" නම් රහතන් වහන්සේගේ මැදිහත් වීමෙන් මොග්ගලීපුත්තතිස්ස මහ තෙරුන් වහන්සේගේ හා වරුණ තෙරුන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා ආචාර්යත්වයෙන් පැවිද්ද හිමි කර ගත් බව සාකච්ඡා කරන්න.
- නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ මහ මග වඩින විට උන්වහන්සේගේ චරිතයෙන් මතු වූ ආදර්ශවත් ඇවතුම් පැවතුම් පිළිබඳ ලේඛනයක් සැකසීමට උපදෙස් දෙන්න.
- මාලිගාවේදී රජතුමාගේ ඉදිරිපිටදී ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කළ ආකාරය සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- අශෝක අධිරාජ්‍යයා සමග සිදු කළ සාකච්ඡාව නාට්‍ය පිටපතක දෙබසක් සේ තැනීමට උපදෙස් දෙන්න.
- අශෝක රජතුමා නිග්‍රෝධ සාමනේරයන් වහන්සේ කෙරෙහි පැහැදීමට බලපෑ හේතු අභ්‍යාස පොතෙහි සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සඳලුතල - සඳැල්ල, චන්ද්‍රිකා තලය
- පිරිමඬුළු - හාත්පසින් වටකොට (දෙවුර වැසෙන සේ චීවරය පෙරවීම)
- සේඛියා - හික්මිය යුතු (පිළිපැදිය යුතු කරුණු)
- බත් වර අටක් - දන් මුර අටක් (දන්වතා අටක්)

## 08. ගුණාත්මක යෙදවුම් :-

- අශෝක අධිරාජ්‍යයාගේ හා නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ රූව සහිත පින්තූරය
- පෙළපොතේ දහසය වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම.
- කථාව පුවත නිරවුල්ව හා පැහැදිලිව ඉදිරිපත් කිරිම
- අවංකව, අධිෂ්ඨානශීලීව ක්‍රියා කිරීමෙන් තමාට පමණක් නොව සමස්ත සමාජයටම සිදුවන මෙහෙය පිළිබඳ පැහැදිළි කිරීම.
- "අප්පමාදෝ අමත පදං" යන ගාථාව පාඩම් කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- සිංහල බෝධි වංශය

# 17 පාඩම
# සිල් පිරෙන්නට වත් පුරමු

**01. නිපුණතාව :- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩ ගසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 3.1**

- භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ප්‍රගුණ කරයි.

**03. කාලච්ඡේද :-** 05 යි

**04. ඉගෙනුම් පල :-**

- භික්ෂු ජීවිතයට වතාවත්හි ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- භික්ෂු ජීවිතය හා වතාවත්හි ඇති සබඳතා පිළිගනිමින් කටයුතු කරයි.
- භික්ෂු ජීවිතයට අදාළ වතාවත් ලේඛනගත කරයි.
- විනයානුකූල ජීවිතයක් ගත කරයි.
- ප්‍රසන්න ජීවිතයකට මග සලසා ගනියි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- පෙළ පොතෙහි 17 වැනි පාඩම කියවාගෙන එන ලෙස සිසුන් ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- විහාර මන්දිරය, සැමළුව, බෝමළුව අමදින භික්ෂූන් වහන්සෙලාගේ වතාවත් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේදවලට වෙන්කරවා ගන්න.
- චුල්ලවග්ග පාලියෙහි වත්තක්ඛන්ධකයෙහි පැවිදි භික්ෂූන් වහන්සේලා සඳහා වත් පිළිවෙත් අනුදැන වදාරා ඇති බව පැහැදිලි කරන්න.
- පාඩමෙහි සඳහන් වතාවත් දහහතර සිසුන්ගෙන් අසා කලුලෑල්ලෙහි ලියා ඒවා එකින් එක පිළිබඳ සාකච්ඡා කර වතාවත් පිළිබඳ අදහස් ඉස්මතු කරගැනීමට සිසුන් මෙහෙයවන්න.
- භික්ෂු සමාජයේ සඟ සමගිය ඇති කරන වතාවත්, භේදයකින් තොරව සෑම භික්ෂූන් වහන්සේ නමක විසින් ම ඉටු කළ යුතු ගුණාංගයක් බව සාකච්ඡා කරන්න.
- වත්තක්ඛන්ධකයෙහි දැක්වෙන වතාවත් දහ හතර අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එක් එක් වතාවතක වැදගත්කම පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඒ ඒ වතාවත්හි අඩංගු වැදගත් කරුණු ගොනු කර ලේඛනයක් සැකසීමට උපදෙස් දෙන්න.
- එම කරුණු අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- "වත්තං න පරිපූරෙන්තෝ" ගාථාව කට පාඩම් ගන්න.
- තමාට දිනපතා පිරිවෙනෙහි දී ඉටු කිරීමට ඇති වතාවත් පිළිවෙළින් ලියා අභ්‍යාස පොතෙහි සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සාමීචිපටිපන්න - ගරු බුහුමන් ලැබීමට සුදුසු ආර්ය මාර්ග ප්‍රතිපදාව පුරන
- පිරිවෙන - පිරුවන - පිරිවෙන්
- තුදුසක් - දහ හතරක්
- දුකුළා - දෙසීමෙන් පිරිසිදු විය හැකි සුළු ආපත්තිය
- පාදුකාව - වැසිකිළියෙහි මල මූත්‍ර කිරීමට හිඳ ගන්නා විට පාද තබා ගන්නා ස්ථානය.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ දහ හත්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- තුදුස්වත වතාවත් කට පාඩමින් කීම
- වතාවත්හි අඩංගු කරුණු නිවැරැදිව දැක්වීම
- ප්‍රායෝගික ව වතාවත්හි නියැලීම
- එක් එක් වතාවත්හි අඩංගු කරුණු සහිත නිවැරැදි ලේඛනයක් ප්‍රදර්ශනය කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- චුල්ලවග්ග පාලිය - වත්තක්ඛන්ධකය

සැ. යු : ප්‍රවේශය සඳහා සාකච්ඡාව මෙහෙයවීමට ගුරු කේන්ද්‍රීය සාකච්ඡා ක්‍රමය හෝ සිසුන් කණ්ඩායම් කර ඒ ඒ කණ්ඩායම තුළ සාකච්ඡාවක් හෝ මෙහෙයවන්න. කෙසේ නමුත් ගුරුවරයා සෑම කණ්ඩායමකටම මඟ පෙන්වීම අත්‍යවශ්‍ය වේ.

# 18 පාඩම
# මහණකම නම් උසස් ම ශීලාචාරකමයි

## 01. නිපුණතාව :- 3.0

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගසා ගනියි.

## 02. නිපුණතා මට්ටම :- 3.1

- හික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ප්‍රගුණ කරයි.

## 03. කාලච්ඡේද :- 11 යි

## 04. ඉගෙනුම් පල :-

- "සේඛියා ධර්ම" යන්න පැහැදිලි කරයි.
- කථා බහ, ඇඳුම, ගමන බිමන ආචාරශීලී විය යුතු බව පිළිගනිමින් කටයුතු කරයි.
- සේඛියා ධර්ම ඇසුරෙන් ආචාර ධර්ම ලේඛනයක් සකස් කරයි.
- දෛනික ජීවිතයේදී ආචාර ධර්ම පිළිපදියි.
- ක්‍රියාශීලී අයෙකු වෙයි.

## 05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-

I පෙර සූදානම

- පෙළ පොතෙහි 18 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් ව දැනුවත් කරන්න. එහි සඳහන් සේඛියා අර්ථ සහිත ව වනපොත් කිරීමට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- දෛනිකව පිරිවෙනට පැමිණි පසු ඔබ විසින් පළමුව කළ යුතු කාර්යයන් මොනවා ද ? යන්න විමසමින්, පළමුව වතාවත් කිරීම සුදුසු බව යෝජනා කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- සුදුසු පරිදි කාලච්ඡේද වෙන්කර ගන්න.
- අනේපිඬු සිටුතුමාගේ දියණිය චූල සුභද්‍රා, නිගණ්ඨයන් පිළිකුල් කරමින් ශ්‍රමණයන් වහන්සේලා ඉතාම ආචාර සම්පන්න පිරිසක් බව ගාථා හතකින් උග්ග සිටුතුමාට වර්ණනා කළ ආකාරය පැහැදිලි කරන්න.
- ආචාරශීලී ජීවිතයක් ගත කිරීමට සේඛියා ධර්ම උපයෝගී වන බවත් සේඛියා ශික්ෂා පද 75ක් ඇති බවත් පරිමණ්ඩල වග්ගය, සක්කච්ච වග්ගය, කබල වග්ගය, සුරු සුරු වග්ගය යන සේඛියා වග්ග හතර මගින් සේඛියා 36ක් පාඩමෙහි සඳහන් වන බවත් සාකච්ඡා කරන්න.

- එක් දිනයකට අර්ථය සහිතව සේඛියා තුනක් කටපාඩම් ගන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකි නෙක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එක් එක් වග්ගවලට අයත් සේඛියාවන්හි අරුත් ප්‍රදර්ශනය කරන පුවරුවක් සැකසීමට උපදෙස් දෙන්න.
- මෙම ආචාර ධර්ම පද්ධතියට සමාන සමාජයේ පිළිගත් සීලාචාරකම් ලැයිස්තුවක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- සේඛියාවල කියවෙන ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන පුද්ගලයන් පිළිබඳ උදාහරණ තේමා කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න. උදා - ශබ්ද නගා ආහාර ගැනීම.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සංවර කරගත යුතු කයෙහි පවතින ප්‍රධාන ඉරියව් - ගමන් කිරීම, හිඳ ගැනීම, සිට ගැනීම, නිදා ගැනීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ දහ අටවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- සේඛියා අර්ථ සහිත ව වණපොත් කිරීම
- අර්ථ නිවැරැදි ව ඉදිරිපත් කිරීම
- දෛනික ජීවිතයේ දී වැදගත් වන ආචාර ධර්ම ලැයිස්තු ගත කිරීම.
- සේඛියා අඩංගු කරුණු සහිත නිවැරැදි ලේඛනයක් ප්‍රදර්ශනය කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ශික්ෂා පද - සේඛියා 75

සැ. යු : සාකච්ජාව මෙහෙයවීමේ දී බුද්ධි කලම්භනය, ප්‍රශ්නකරණය හෝ රූප ප්‍රදර්ශනය යොදාගෙන ශිෂ්‍යයාට පාඩම පිළිබඳ ආශාවක් ඇති වන ආකාරයට කිරීම ඉතා යෝග්‍ය වේ.

# 19 පාඩම
# ධම්ම පදය - I

**01. නිපුණතාව :- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර, අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**02. නිපුණතා මට්ටම :- 5.1**

- ධම්මපද ගාථා ගුරුකොට, තම ජීවිතය සාර්ථක කොට ආදර්ශ සපයයි.

**03. කාලච්ඡේද :-** 12 යි

**04. ඉගෙනුම් පල :-**

- "ධම්මපදය" පිළිබඳ පැහැදිලි කරයි.
- "ධම්මපදය" සාර්ථක ජීවිතයකට මග පාදන බව පිළිගනිමින් කටයුතු කරයි.
- යමක වග්ගයෙහි ගාථා මතකයෙන් සජ්ඣායනය කරයි.
- සාර්ථක ජීවිතයක් ගත කරයි .
- කර්මපල විශ්වාසයෙන් කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- යමක වග්ගය දැක්වෙන පෙළ පොතෙහි 19 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් ව දැනුවත් කරන්න. එහි සඳහන් පළමු ධම්මපද ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- "මනෝ පුබ්බංගමා ධම්මා" යන යමක වග්ගයෙහි පළමුවන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් ගාථාව ශබ්ද නගා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමග එකට සජ්ඣායනය කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- "ගැල ඇදගෙන යන ගොනුන්ගේ පසු පස එන රිය සක මෙන්" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? යන්න සාකච්ඡා කරමින් කුසලාකුසල කර්මය පිළිබඳ අදහස ඉස්මතු කරගැනීමට සිසුන් ව මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- සුදුසු පරිදි කාලච්ඡේද වෙන්කර ගන්න.
- ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15න් ධම්මපදය එක් ග්‍රන්ථයක් යන්න පැහැදිලි කරන්න.

- ධම්මපද ග්‍රන්ථයේ පළමු වග්ගය යමක වග්ගය බවත් එහි ගාථා 8ක් පාඩමෙහි සඳහන් වන බවත් සාකච්ඡා කරන්න.
- එක් දිනකට ගාථා එකක් කටපාඩම් ගන්න.
- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම දුරවබෝධ වචන එකිනෙක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- නිධාන කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- හේසජ්ජිකංග ධූතාංගය - නොනිදා සිටීමෙන් පමණක් ඊය පහන් කිරීම.
- උක්ඛේපනීය කර්මය - එකට වාසයෙන් තොර වීම.( සසුනෙන් නෙරපීම)
- සෝසානික ධූතාංගය - සුසානයෙහිම වාසය කිරීම

## 08. ගුණාත්මක යෙදවුම් :-

- "මනෝ පුබ්බංගමා ධම්මා" ගාථාව ලියන ලද පුවරුව
- පෙළපොතේ දහ නවවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- ගාථා නිවැරැදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- ගාථාවේ අර්ථය සරල පැහැදිලි කිරීම
- නිධාන කථාව පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම
- කර්මය හා කර්ම විපාකය පිළිබඳව හැඳින්වීමක් කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- පන්සිය පනස් ජාතක පොත - ලටුකික ජාතකය
- පන්සිය පනස් ජාතක පොත - දීඝිති කෝසල ජාතකය

# 20 පාඩම
# ධම්ම පදය - II

## 01. නිපුණතාව :- 5.0

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර, අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිඵල සම්පන්න භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

## 02. නිපුණතා මට්ටම :- 5.1

- ධම්මපද ගාථා ගුරුකොට, තම ජීවිතය සාර්ථක කොට ආදර්ශ සපයයි.

## 03. කාලච්ඡේද :- 10 යි

## 04. ඉගෙනුම් පල :-

- යමක වග්ගයේ ගාථාවන්ට අයත් දහම් කරුණු විස්තර කරයි.
- අදාළ ගාථා තුළින් ජීවිතාදර්ශ පිළිගනිමින් කටයුතු කරයි.
- අදාළ ධම්මපද ගාථා මතකයෙන් සජ්ඣායනය කරයි.
- යමක් කිරීමට ප්‍රථමයෙන් සැලකිලිමත් ව කටයුතු කරයි.
- ධර්ම චර්යාවෙහි යෙදෙයි.

## 05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-

I පෙර සූදානම

- යමක වග්ගය දැක්වෙන පෙළ පොතෙහි 20 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. එහි සඳහන් පළමු ධම්මපද ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- "අනික්කසාවො කාසාවං" යන යමක වග්ගයෙහි ගාථාව ශබ්ද නගා නිවැරැදිව සජ්ඣායනය කර සිසුන් සමඟ සජ්ඣායනය කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම ගාථාවෙන් කියවෙන්නේ කුමක් ගැන ද? යන්න සාකච්ඡා කරමින් කසාවත දරා සිටීමට සුදුසු නොවන්නා පිළිබඳ අදහස ඉස්මතු කරගැනීමට සිසුන්ව මෙහෙයවන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- සුදුසු පරිදි කාලච්ඡේද වෙන්කර ගන්න.
- ධම්මපද ග්‍රන්ථයේ පළමු වග්ගය "යමක වග්ගය" බවත් එහි ගාථා 20ක් පාඩමෙහි සඳහන් වන බවත් සාකච්ඡා කරන්න.

- එක් දිනකට ගාථා එකක් කටපාඩම් ගන්න.
- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම දුරවබෝධ වචන එකිනෙක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොතක් සැකසීමට උපදෙස් දෙන්න.
- නිධාන කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සෙරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ගිරග්ග සමජ්ජ - බුද්ධ කාලයේදී දඹදිව රජගහනුවර පැවති නාට්‍ය සංදර්ශනයක්
- කෙණෙස්සක් - හැන්දක්
- නැළිය - කුරුණියෙන් හතරෙන් පංගුව

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ විසිවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- ගාථා නිවැරැදි ව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- ගාථාවේ අර්ථය සරල පැහැදිලි කිරීම
- නිධාන කථාව පැහැදිලිව මතකයෙන් ඉදිරිපත් කිරීම
- සරු හා නිසරු දෙය පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- පන්සිය පනස් ජාතක පොත - ඡද්දන්ත ජාතකය
- පන්සිය පනස් ජාතක පොත - ගද්‍රභ ජාතකය

සැ. යු :
- සෑම ධම්ම පද ගාථාවක් ම කට පාඩම් ගන්න.
- එහි සරල අදහස මතකයෙන් කිවීමට ක්‍රියාකාරකම් ගොනු කරන්න.
- නිදාන කථාව මතකයෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න.

# 21 පාඩම
# ධම්ම පදය - III

## 01. නිපුණතාව :- 5.0

- ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කරගනී.

## 02. නිපුණතා මට්ටම :- 5.1

- ධම්මපද ගාථා ඇසුරින් තම ජීවිත සාර්ථක කොට ආදර්ශ සපයයි.

## 03. කාලච්ඡේද :- 9 යි

## 04. ඉගෙනුම් පල :-

- යමක වර්ගයට අයත් ධම්මපද ගාථාවල අරුත් පවසයි.
- ධම්මපද ගාථාවල ඇති ධර්ම කරුණු අර්ථවත් බව පිළිගනිමින් කථා කරයි.
- ගාථාවලට අදාළ නිධාන කථා මතකයෙන් කියයි.
- කර්මය හා කර්ම ඵලය විශ්වාස කර ගනිමින් තම ජීවිතය අවිහිංසාවාදීව ගත කරයි.
- සිසුවා තම ජීවිතය ධර්මානුකූලව ගත කරයි.

## 05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-

I පෙර සූදානම

- යමක වග්ගයේ ඇතුළත් පෙළ පොතෙහි 21 වන පාඩම කියවා පැමිණෙන ලෙස සිසුන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 1 හි ඇතුළත් "ඉධමෝදති" යන ගාථාව පන්තියේ ප්‍රදර්ශනය කරමින් ගාථාව ශබ්ද නගා සිසුන් සමඟ සජ්ඣායනා කර එහි අර්ථය සාකච්ඡා කොට ධම්ම පදය ගාථා ඉස්මතුකොට ගන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- පාඩමට අදාළව කාලපරිච්ඡේද 9 ක් ඇති බැවින් ගාථා 5 ක් සහ නිධාන කථා 5 ආවරණය කර ගැනීමට සුදුසු පරිදි කාලපරිච්ඡේද වෙන් කර ගන්න.
- ගාථා උච්චාරණය කරන ආකාරය කියා දෙන්න.
- ගාථාව සහ අර්ථය කටපාඩමින් සජ්ඣායනය කරවන්න.
- නිධාන කථාව කොටස් වශයෙන් සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- ගාථාවල ඇතුළත් ධර්ම කරුණු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ගාථාව සහ අර්ථය සිසුවාගේ අභ්‍යාස පොතේ ලියවා ඇගයීමක් කරන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ ලියවන්න.

- තක්සේරුකරණය නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව සිසුන් තක්සේරුකරණය කරන්න.
- සාධන මට්ටමට ළඟා නොවූ සිසුන්ව ප්‍රතිපෝෂණ ක්‍රියාවලියෙහි නිරත කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- පංචානන්තරිය පාප කර්මය - බුදුරදුන්ගේ ඇගේ ලේ සෙලවීම, රහතන් වහන්සේ, සංඝ භේදය, මව මැරීම, පියා මැරීම
- පස්ගෝරස - කිරි, දී කිරි, මෝරු, වෙඬරු, ගිතෙල්

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 1 "ඉධමෝදති පෙච්ච මෝදති...." යන ගාථාව ලියූ පුවරුව
- පෙළපොතේ විසි එක්වන පාඩම
- ගාථාවන් ලියූ පුවරුව
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ගාථා නිවැරැදිව මතකයෙන් සජ්ඣායනය කිරීම
- ගාථාවල අර්ථය සරලව පැහැදිලි කිරීම
- නිදාන කථාව සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම
- දෙව්දත් තෙරුන්ගේ පංචවරය මතකයෙන් ලිවීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ධර්ම විනිශ්චය
  (රේරුකානේ චන්දවිමල මහ නාහිමි)

සැ. යු :
- සෑම ධම්ම පද ගාථාවක් ම කට පාඩම් ගන්න.
- සෑම ධම්ම පද ගාථාවක ම සරල අර්ථය අභ්‍යාස පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.
- ධම්ම පද ගාථාවට අදාළ නිධාන කථාව මතකයෙන් ප්‍රකාශ කිරීමට සුදුසු ක්‍රියාකාරකමක් ගොනු කරන්න.
- ධම්ම පද ගාථාවලින් හෙළි කරන ජීවිකාවබෝධය පිළිබඳ සාකච්ඡා කර එම යහපුරුදු ප්‍රායෝගිකව ජීවිතයට යොදා ගන්නා ආකාරය පැහැදිලි කර දෙන්න.

# 22 පාඩම
# ධම්ම පදය - IV

**01. නිපුණතාව :- 5.0**

- බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථාවල චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු ජීවිතයකට මග සලසා ගනී.

**02. නිපුණතා මට්ටම :- 2.5.1**

- ධම්මපද ගාථා ගුරු කොට තම ජීවිත සාර්ථක කොට ආදර්ශ සපයයි.

**03. කාලච්ඡේද :-** 18 යි

**04. ඉගෙනුම් පල :-**

- අදාළ ධම්මපද ගාථාවල අර්ථ විස්තර කරයි.
- ධම්මපද ගාථා සාර්ථක ජීවිතයකට මග සලසන බව පිළිගනිමින් කථා කරයි.
- අදාළ ධම්මපද ගාථා සහ අර්ථ මතකයෙන් කියයි.
- නිවැරැදි ජීවිතයක් ගත කරයි.
- දිවිහිමියෙන් මව්පියන් පෝෂණය කරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම
- ධම්ම පදය IV කොටස හොඳින් කියවා එන ලෙස සිසුන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය
- "උට්ඨානවතො සතිමතො...." යන ගාථාව ලියූ පුවරුව පන්තියට ඉදිරිපත් කොට එය සිසුන් සමග ද සජ්ඣායනා කර එහි තේරුම සාකච්ඡා කරමින් පාඩම ආරම්භ කරන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද 18 ක් ඇත.
- එක් කාලරිච්ඡේදයක් තුළ එක් ගාථාවක් සහ එයට අදාළ අර්ථය සාකච්ජාවට ගන්න. එය අභ්‍යාස පොතේද සඳහන් කරන්න. එම අවස්ථාවේදී ඇගයීම සිදු කිරීමේදී සිසුවාගේ අභ්‍යාස පොතේ ලියවීමෙන් පසු ✓ ක් සහ ⋆ ක්ද ලබා දෙන්න.
- අනතුරුව නිධාන කියවා ප්‍රශ්නෝත්තර ද මතු කරගනිමින් සාකච්ජාවක් මෙහෙයවන්න.
- සප්තවත පද ද පාඩම් කරවා අභ්‍යාස පොතේ ලියවන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ ලියවන්න.
- තක්සේරුකරණය නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව සිසුන් තක්සේරුකරණය කරන්න.
- ගාථාවල ධර්ම කරුණු මෙන්ම අර්ථය ද නිධාන කථාවේ තොරතුරු වැනි වැදගත් කරුණු ආවරණය වන පරිදි ඇගයීම සැකසීම සිදු කරන්න.

- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් හට ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- අංග ලක්ෂණ - ශාරීරික කොටස්වල පිහිටීම
- සුළු පියා - බාප්පා
- අහිවාතක - සර්පයන්ගේ විස දුමකිං හටගන්නා රෝගයකි.
- කුම්භසෝෂක - කළයක හඬ මෙන් ගැඹුරු හඬක් ඇති
- පන්ථක - අතර මගදී උපන්
- සිව්පිළිසිඹියා - අර්ථ ධර්ම නිරුත්ති පටිභාණ
- චුති උප්පත්ති - නැවත ඉපදීම
- නොහොඹිනා - නොගැලපෙන, නුසුදුසු

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 1 "උට්ඨානවතො සතිමතො...." යන ගාථාව ලියූ පුවරුව
- පෙළපොතේ විසි දෙවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- ගාථා සහ අදාළ සරල අර්ථ කටපාඩමින් කීම
- නිධාන කථා සැකෙවින් විස්තර කිරිම
- ගාථාවල ඇතුළත් ධර්ම කරුණු පැහැදිලි කිරීම
- නිධාන කථාවල ඇතුළත් ආදර්ශවත් චරිත නම් කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ධම්මපද විවරණය
  (පොල්වත්තේ බුද්ධදත්ත හිමි)

සැ. යු :
- සෑම ධම්ම පද ගාථාවක් ම කට පාඩම් ගන්න.
- සෑම ධම්ම පද ගාථාවක ම සරල අර්ථය අභ්‍යාස පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.
- ධම්ම පද ගාථාවට අදාළ නිධාන කථාව මතකයෙන් ප්‍රකාශ කිරීමට සුදුසු ක්‍රියාකාරකමක් ගොනු කරන්න.
- ධම්ම පද ගාථාවලින් හෙළි කරන ජීවිකාවබෝධය පිළිබඳ සාකච්ඡා කර එම යහපුරුදු ප්‍රායෝගිකව ජීවිතයට යොදා ගන්නා ආකාරය පැහැදිලි කර දෙන්න.

# 23 පාඩම
# මංගල සූත්‍රය

**01. නිපුණතාව :- 4.0**

- ත්‍රිපිටක සූත්‍ර ධර්ම අධ්‍යයනය කරමින් නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ග යෙන් ගමන් කරයි.

**02. නිපුණතා මට්ටම :- 4.1**

- ලෞකික, ලෝකෝත්තර දියුණුව සඳහා නිවැරැදි දැක්මක් ඇති කායික, මානසික, වාචසික ක්‍රියාවන්හි නිරත වෙයි.

**03. කාලච්ඡේද :-** 12 යි

**04. ඉගෙනුම් පල :-**

- මහා මංගල සූත්‍රයේ නිධාන කථාව පැහැදිලි කරයි.
- නිවැරැදි දැක්මකින් යුතුව කායික, මානසික, වාචසික ක්‍රියාවන්හි නිරත විය යුතු බව පිළිගනිමින් කථා කරයි.
- මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු 38 ලියයි.
- විචාරශීලීව කටයුතු කරයි.
- මංගල කරුණු ජීවිතයට එක් කරගෙන චර්යාවන්හි යෙදේ.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- මංගල කරුණු 38 හෝ කිහිපයක් ලියූ පුවරුවක් සකසා රැගෙන එන්න.

II ප්‍රවේශය

- හූනාගේ එක් එක් හඬ ඇසීම, කපුටා කාක් කාක් ගෑම, පෙර මගට හිස් කළයක් ගෙන ඒම, මද සුළඟක් හැමීම වැනි අවස්ථා ගැන සිසුන්ගෙන් විමසා ප්‍රශ්න නගමින් සාකච්ඡා කර මංගල යන අර්ථය ඉස්මතු කර ගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- මහා මංගල සූත්‍රයේ නිධාන ගාථාව කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- කාලච්ඡේද 12 ප්‍රමාණවත් ලෙස කොටස් කර ගාථා සහ අර්ථ සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ ලියන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුවා කියවූ කොටස පැහැදිලි කරන අතර ප්‍රශ්නෝත්තර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- මංගල සූත්‍රයට අයත් ගාථා සහ අර්ථ සිසුන්ට කොටස් කර දී කට පාඩම් ගන්න.

- ගාථා සහ අර්ථ අභ්‍යාස පොතේ ලියවා පරීක්ෂා කර තරු ලකුණක් හෝ හරියක් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළ ව සිසුන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- බූමාටු දේවියන් යනු පොළොවෙහි වෙසෙන දෙවි කෙනෙකි.
- චාතුර් මහා රාජිකය යනු දිව්‍යලෝක හයෙන් පළමු වන දිව්‍යාලෝකයයි. ආයුෂ වශයෙන් ගත් කළ වර්තමානයේදී මිනිසාගේ පරම ආයුෂ අවු. 120 වන අතර දෙවියන්ගේ පරම ආයුෂ අවුරුදු 500 වේ.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ විසි තුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- මංගල සූත්‍රයට අදාළ නිධාන කථාව පැහැදිලි කිරීම
- සිසුවෙකුට එක් ගාථාව බැගින් ලබාදී සරල අර්ථය පැහැදිලි කිරීම.
- අදාළ ගාථා නිවැරැදිව කට පාඩමෙන් කීම.
- මංගල කාරණා 38 අතුරින් ශිෂ්‍යයෙකු වශයෙන් සම්පූර්ණ කළ හැකි කරුණු මොනවාදැයි වෙන්කර ලිවීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- ධර්ම විනිශ්චය
  (පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි)

සැ. යු :
- මහා මංගල සූත්‍රය වනපොත් කිරීමට දෙන්න.
- පාඩම සංවර්ධනය කරන සෑම දිනකම සියලුම සිසුන් සමග එකතු වී හෝ කණ්ඩායම් වශයෙන් හෝ කලානුරූපව සජ්ඣායනා කිරීමට යොමු කරන්න.
- එක් එක් ශිෂ්‍යයාගෙන් මංගල සූත්‍රය පිළිබඳ ක්‍රියාකාරමකම් අභ්‍යාස සිදු කිරීමට මඟ පෙන්වන්න.

# 24 පාඩම
# කය නම් අසාරය

## 01. නිපුණතාව :- 6.0

- බෞද්ධ භාවනාවේ මූලික අංග ප්‍රගුණ කරමින් ජීවිතයේ යථාවබෝධය පිණිස භාවනාවේ යෙදේ.

## 02. නිපුණතා මට්ටම :- 6.1

- කායගතාසති භාවනාවේ මූලික අංග ප්‍රගුණ කරමින් ප්‍රායෝගික වටිනාකමද හැඳිනගෙන භාවනා කරයි.

## 03. කාලච්ඡේද :- 09 යි

## 04. ඉගෙනුම් පල :-

- කායගතාසති භාවනාවේ අංග පැහැදිලි කරයි.
- ජීවිතයේ ඇති අනියත බවත් මරණයේ ඇති නියත බවත් පිළිගනිමින් කථා කරයි.
- මිනිස් සිරුරක රූපසටහනක් ඇඳ එහි දෙතිස් කුණප තිබෙන තැන් සලකුණු කරයි.
- කායගතාසති භාවනාවේ යෙදෙයි.
- නිසරු දෙය බැහැර කරයි. සරු දෙය පිළගනී.

## 05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-

I පෙර සූදානම

- "කය නම් අසාරය" පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ සිසුන් දැනුවත් කරන්න.
- "භාවෙති කුසලෙ ධම්මේ" යන වැකිය කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- මිනිස් සිරුරක රූපසටහනක් පන්තියේ ප්‍රදර්ශනය කරමින් ප්‍රශ්න අසමින් පිළිතුරු ලබා ගනිමින් එහි දෙතිස් ගුණ ඇති තැන් මතු කරමින් සාකච්ඡාව ආරම්භ කරන්න.

## 06. පාඩම් සංවර්ධනය :-

- භාවනාව යනු කුමක්දැයි සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවීම.
- භාවනා කිරීමෙන් සිත, කය, වචනය දුසිරිතෙන් මිදී සංවර වන බව ප්‍රශ්නෝත්තර මගින් පැහැදිලි කරන්න.
- දෙතිස් කුණප කොටස් නිවැරැදිව උච්චාරණය කරමින් පාඩම් කරවන්න.
- සිසුන් සමඟ බුදු මැදුරට ගොස් භාවනාව කරන ආකාරය පළමු පියවර, දෙවන පියවර ආදී වශයෙන් යෙදෙන්න.
- දෙතිස් කුණප කොටස් 32 එක් කාලච්ඡේදයකට 10 බැගින් ඇතුළත් වන සේ පාඩම් කර ගැනීමට උපදෙස් දෙන්න.

- පාඩමේ ඇති සෙසු කොටසද ඉතිරි කාලපරිච්ඡේද 5 ට ගැලපෙන සේ බෙදා පාඩම සංවර්ධනය කර ගන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරු භවතා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළ ව සිසුන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- ත්‍රිශික්ෂාව - සීල, සමාධි, ප්‍රඥා
- නීවරණ ධර්ම - කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා
- පංචස්කන්ධ - රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ
- අනුලෝම - මුල සිට අග දක්වා
- ප්‍රතිලෝම - අග සිට මුල දක්වා
- පටික්කුල මනසිකාරය - පිළිකුල් භාවනාව

## 08. ගුණාත්මක යෙදවුම් :-

- ඇමුණුම 1 මිනිස් රූප සටහනක්
- පෙළපොතේ විසි හතරවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- මිනිස් සිරුරක රූප සටහනක් ඇඳ එහි දෙතිස් කුණපයන් තිබෙන තැන් සලකුණු කරන්න.
- තචපංචකය ලියා දක්වන්න.
- දෙතිස් කුණප කොටස් වලින් 10 ක් අනුපිළිවෙළට අර්ථ සහිතව ලයා දක්වන්න.
- භාවනාවේ අගය විස්තර කිරීම.

## 10. වැඩිදුර පරිශීලනයට :-

- විදර්ශනා භාවනා ක්‍රමය
(මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහනාහිමි)

# 25 පාඩම
# දැන දැන සිහියෙන් වැඩ කරමු

**01. නිපුණතාව :- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලික අංග පුගුණ කරමින් ජීවිතාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**02. නිපුණතා මට්ටම :- 6.1**

- සතිමත්ව කටයුතු කර තම ජීවිතය සාර්ථක කර ගැනීමට මග සලසා ගනී.

**03. කාලච්ඡේද :-** 06 යි

**04. ඉගෙනුම් පල :-**

- සතිමත්ව කටයුතු කර ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු විස්තර කරයි.
- ජීවිතය සාර්ථක කර ගැනීමට සිහියෙන් යුතුව වැඩ කළ යුතු බව පිළිගනිමින් කථා කරයි.
- සිහියෙන් වැඩ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.
- කාල කළමනාකරණයෙන් යුතුව කටයුතු කරයි.
- සිතා, විමසා බලා සිහියෙන් කටයුතු කරයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- "දැන දැන සිහියෙන් වැඩ කරමු" යන පාඩම කියවාගෙන එන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 1 ට අදාළ බිත්ති ඔරලෝසුව පන්තියේ ප්‍රදර්ශනය කරමින් කාලය භාවිතා කිරීම හා සම්බන්ධ තොරතුරු විමසමින් උදෑසන අවදි වීමේ සිට නොයෙක් වැඩවල යෙදීමත් ඒවා සිහියෙන් නොකරන අවස්ථා විමසමින් සිහිය යන්න ඉස්මතු කර ගැනීම.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද 6 කට ප්‍රමාණවත් ලෙස පාඩම කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- සම්පජඤ්ඤය යනු කුමක්දැයි පැහැදිලි කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- පුන ච පරං භික්කවෙ භික්බු යන පාඨය සහ අර්ථය සිසුන්ට කොටස් කරදී කටපාඩම් කරවන්න. උච්චාරණ විධි කියා දෙන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

- තක්සේරුකරණ නිර්ණායක ඔබ විසින් කියවා අවබෝධ කරගෙන එම නිර්ණායක වලට අදාළව සිසුන් තක්සේරුකරණය කරන්න.

## 07. මූලික වදන් හා සංකල්ප :-

- සම්පජඤ්ඤය යනු - කරන හැම දෙයක්ම දැනගෙන සිහි කල්පනාවෙන් කිරීම.
- චතුසම්පජඤ්ඤය යනු - කරන කියන හැම දෙයක්ම දැනගෙනම කරන ආකාර සතරයි.

## 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ විසි පස්වන පාඩම
- ඇමුණුම 1 බිත්ති ඔරලෝසුව
- ගුරු මාර්ගෝපදේශය

## 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- සතිමත්ව කටයුතු කිරීමට උදාහරණ දැක්වීම
- සිහියෙන් වැඩ කිරීමේ ප්‍රයෝජන ලැයිස්තුගත කිරීම
- කාල කළමනාකරණයේ අගය දැක්වීම
- ගොචර සම්පජඤ්ඤය විස්තර කිරීම

## 10. වැඩිදුර පරිශීලනයට :-

- විදර්ශනා භාවනා ක්‍රමය
  (මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහනාහිමි)

# 26 පාඩම
# ජීවිතය අනියතයි මරණය නියතයි

**01. නිපුණතාව :- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් ජීවිතාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**02. නිපුණතා මට්ටම :- 6.1**

- මරණානුස්සති භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරයි.

**03. කාලච්ඡේද :-** 07 යි

**04. ඉගෙනුම් පල :-**

- මරණානුස්සති භාවනාවේ මූලිකාංග පැහැදිලි කරයි.
- ජීවිතයේ ඇති අනියත බවත් මරණයේ ඇති නියත බවත් පිළිගනිමින් කථා කරයි.
- මරණානුස්සති භාවනාව වඩන පිළිවෙළ මතකයෙන් කියයි.
- මරණානුස්සති භාවනාවේ යෙදෙයි.
- නිසරු දේ නිසරු ලෙසත් සරු දේ සරු ලෙසත් වටහාගෙන ජීවත් වෙයි.

**05. පාඩම් සැලසුම් සඳහා උපදෙස් :-**

I පෙර සූදානම

- ජීවිතය අනියතයි, මරණය නියතයි යන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේදී සිසුන්ව දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- මිනිස් සිරුරක රූප සටහනක් පන්තියේ ප්‍රදර්ශනය කරමින් ජීවිතයේ අනිත්‍යතාවය පිළිබඳ ප්‍රශ්න අසමින් පිළිතුරු ලබා ගනිමින් සිරුරේ කොටස් ස්ථිර නොවන බව හා අස්ථිර බව ඉස්මතු කර ගන්න.

**06. පාඩම් සංවර්ධනය :-**

- කාලපරිච්ඡේද 7 කට ප්‍රමාණවත් ලෙස පාඩම කොටස් කර සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කරගන්නා ලෙස උපදෙස් දෙන්න.
- සිසුවා කියවූ කොටස පැහැදිලි කරමින් ප්‍රශ්නෝත්තර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පාඩමේ ඇති ගාථා 20 ක් කාලපරිච්ඡේදයකට 3 බැගින් අර්ථ සහිතව පාඩම් කරවන්න.
- මරණානුස්සතිය වඩන පිළිවෙළ ද සිසුන් සමඟ සාකච්ඡා කරමින් පැහැදිලි කරන්න.
- සුදුසු වේලාවක් යොදාගෙන මරණානුස්සති භාවනාවේ ප්‍රායෝගිකව යොදවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායක වලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.

- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

### 07. මූලික වදන් හා සංකල්ප :-

- ජීවිත මදය - කම්සැප විඳීමේ දැඩි ආශාවෙන් පිරුණු ජීවිතය
- අවි අමෝරාගත් වධකයෙකු සේ - රාජ අණ පිළිපදින අවියක් අතැති පුද්ගලයා
- අස්ථය කරා - නොපෙනී යාම, සැඟවී යාම
- ධාරානිපාත වැසි - අකුණු ගසමින්, විදුලි කොටවමින්, ගොරවමින් නොකඩවා ඇද වැටෙන තද වැසි

### 08. ගුණාත්මක යෙදවුම් :-

- පෙළපොතේ විසි හයවන පාඩම
- මිනිස් සිරුරක රූප සටහනක්
- ගුරු මාර්ගෝපදේශය

### 09. ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :-

- අදාළ ගාථා හා ඡේද නිවැරැදිව සජ්ඣායනය කිරීම
- මරණානුස්සති භාවනාව වඩන පිළිවෙළ වණපොත් කිරීම
- මරණානුස්සති භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංශ 5 ක් ලිවීම

### 10. වැඩිදුර පරිශීලනයට :-

- විදර්ශනා භාවනා ක්‍රමය

## තක්සේරුකරණය හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෙ ෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වනඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම් ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමකින් සාක්ෂාත් වූයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව

ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.